# මධ්‍යම පළාතේ
# බදු උකස් ගත්තන්ගේ ප්‍රඥප්තිය

මධ්‍යම පළාතේ 2014 අංක 04 දරන බදු උකස් ගත්තන්ගේ ප්‍රඥප්තිය

මධ්‍යම පළාතේ 2015 අංක 01 දරන බදු උකස් ගත්තන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය

මධ්‍යම පළාතේ 2016 අංක 01 දරන බදු උකස් ගත්තන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය

මධ්‍යම පළාතේ බදු උකස් ගත්තන්ගේ ප්‍රඥප්තිය නියෝග අංක 1919/ 32

මධ්‍යම පළාතේ බදු උකස් ගත්තන්ගේ ප්‍රඥප්තිය නියෝග අංක 1976/ 02

## පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
## මධ්‍යම පළාත

අංක 244 , කටුගස්තොට පාර,මහනුවර.
දු.ක. 0812213022 ෆැක්ස් : 0812213033
ඊමේල් :info@revenuedept.cp.gov.lk cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenuedept.cp.gov.lk

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1921/5 – 2015 ජූනි මස 29 වැනි සඳුදා - 2015.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

2014 අංක 04 දරන මධ්‍යම පළාතේ පළාත් සභාවේ බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් 2015.04.07 දින සම්මත කරන ලදුව 2015.05.20 වැනි දින ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කොට ඇති ඉහත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළකරමි.

සරත් ඒකනායක,<br>
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන,<br>
නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක<br>
ඉඩම්, සමූපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ<br>
කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍ය.

2015 ජූනි මස 03 වැනි දින,<br>
මහනුවර,<br>
මධ්‍යම පළාත් සභාවේ,<br>
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**මධ්‍යම පළාතේ පළාත් සභාවේ අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය**

මධ්‍යම පළාත තුළ බැංකුවක් විසින් කරගෙන යනු ලබන බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය හැර බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාර ලියාපදිංචි කිරීම සඳහා ද, විධිමත් කිරීම සඳහා ද, ඊට ආනුෂාංගික හෝ වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, මධ්‍යම පළාත් ආදායම් කොමසාරිස්ට බලය පැවරීම සඳහා ද වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1942 අංක 13 දරන බඩු උකස් ගන්නන්ගේ ආඥා පනත ට අනනුකූල වේ.


1A - PG 2532- 08 (2015/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

### I වන පරිච්ඡේදය
### සාමාන්‍ය

සංක්ෂිප්ත නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන බදු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දින සිට බලාත්මක වන්නේ ය.

### II වන පරිච්ඡේදය
### බදු උකස්ගන්නන්

බදු උකස් ගන්නා

2. (1) බදු උකස් ගන්නා

රාජ්‍ය මුදල් පනත යටතේ ලියාපදිංචි බැංකුවක් නොවන බදු උකස් ගැනීමේ ව්‍යාපාර කරගෙන යනු ලබන බදු උකස් ගන්නෙකු සහ යම් යම් කොන්දේසි මත පසුව නිදහස් කරන බවට හෝ ආපසු මිලදී ගන්නා බවට ප්‍රකාශිත හෝ ව්‍යංග සම්මුතියක් හෝ පිළිගැනීමක් නැතහොත් ගනුදෙනුවේ ස්වරූපය හා ලක්ෂණ අනුව එවැනි සම්මුතියක් හෝ පිළිගැනීමක් ඇතැයි යුක්ති සහගතව උපකල්පනය කළ හැකි සම්මුතියක් ලෙස පිළිගැනීමක් යටතේ හෝ ඒ අනුව බදු මිලට ගැනීම හෝ විකිණීම සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදල් වලට ඇප වශයෙන් භාණ්ඩ ලබාගැනීම සඳහා සාප්පුවක් පවත්වා ගෙන යමින් බදු මිලයට ගෙන හෝ තබාගෙන ඒ වෙනුවෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවන්නා වූ හෝ අත්තිකාරම් වශයෙන් දෙන්නා වූ හෝ ණයට දෙන්නා වූ යම් තැනැත්තෙක්, ආයතනයක්, හවුල් ව්‍යාපාරයක්, සීමිත සමාගමක් අදහස් වේ.

බදු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යාම තහනම් කළ හැකි තැනැත්තන් තහනම් බව

(2) කිසියම් තැනැත්තෙකු -

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු නොවන පුද්ගලයෙකු වන්නේ නම් ; හෝ
(ii) විදේශීය සමාගමක් වන්නේ නම් හෝ
(iii) විදේශීය ව්‍යාපාර ආයතනයක් වන්නේ නම්

නියමිත දිනයේ දී හෝ ඉන්පසු, ඒ තැනැත්තා විසින් උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන නොයා යුතු ය. ඒ අනුව, ව්‍යාපාරය කරගෙන යෑමට නම් පුද්ගලයෙකුට, විදේශීය සමාගමකට හෝ විදේශීය ව්‍යාපාර ආයතනයකට නිකුත් කර තිබුණා වූ ද, නියමිත දිනට පෙරාතුව ම වූ දිනයෙහි වලංගුව පැවතියා වූ ද, යම් බලපත්‍රයක් එකී දිනයේ දී සහ ඉන් පසු අවලංගු වූ ලෙසත් බල රහිත වූ ලෙසත් සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

### III වන පරිච්ඡේදය
### ලියාපදිංචි කිරීම

ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර ලියාපදිංචි විය යුතු බව

3. (1) මෙම ප්‍රඥප්තිය යටතේ උකස් බලපත්‍ර ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙකු විසින්ම තම ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර ලියාපදිංචි වීම සඳහා අයදුම්කර මධ්‍යම පළාත් ආදායම් කොමසාරිස් වෙතින් ඒ සඳහා ලියාපදිංචිය ලබා ගත යුතු ය. මෙතෙක් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර සඳහා 62 වගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

(2) මින් මතු IV වන පරිච්ඡේදයේ දී "බලපත්‍ර ලබා ගැනීම" යටතේ විධිවිධාන සලසා ඇති ආකාරයට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන පළමු ඉල්ලුම් කිරීම එම උකස් ව්‍යාපාරය පවත්වගෙන යාම සඳහා වන පළමු ලියාපදිංචි කිරීම ලෙස සැලකිය යුතු ය.

### IV වන පරිච්ඡේදය
### බලපත්‍ර ලබා ගැනීම

බදු උකස් ගන්නන් විසින් බලපත්‍රයක් ලබාගත යුතු බව

4 (1) බදු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන සෑම ව්‍යාපාර මධ්‍යස්ථානයක් හෝ ශාඛාවක් වෙනුවෙන්ම ඒ එක් එක් ව්‍යාපාරික මධ්‍යස්ථානය හෝ ශාඛාව සඳහා ආදායම් කොමසාරිස්වරයා විසින් වෙන් වෙන් වශයෙන් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙකු

විසින් බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන නොයා යුතු ය.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(3) ඉහත (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම එහි සඳහන් ව්‍යාපාර පරිශ්‍රයට සහ ලිත් වර්ෂයක කාලයක් සඳහා පමණක් වලංගු වන්නේ ය.

5. ඉහත 4(1) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම එක් පිටපතක්, එම බලපත්‍රයට අදාළ උකස් ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ යම් ප්‍රදේශයක් තුළ ද එම ප්‍රදේශය භාරව සිටින පොලිස් අධිකාරීවරයා වෙත ආදායම් කොමසාරිස්වරයා විසින් යැවිය යුතු ය. බලපත්‍රය පිළිබඳ පොලිස් අධිකාරීවරයා වෙත යැවිය යුතු බව.

6. මෙහි 04 (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යම් උකස් ව්‍යාපාරයකට අදාළ වේද එකී බලපත්‍රධාරියා විසින් කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව එම බලපත්‍රය වෙනත් තැනැත්තෙකුට පවරා නොදිය යුතු ය. තවද යම් තැනැත්තෙකු ආදායම් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතියක් නොලබා බලපත්‍රය පවරා දීම ශුන්‍ය හා බල රහිත වන්නේ ය. පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව බලපත්‍රය පැවරීම

7. යම් නීති විරෝධී හෝ යම් අනීතික ක්‍රියාවක් සිදු නොකළ බවට හෝ එවන් යම් ක්‍රියාවකට වරදකරු වී නොමැති බවට හෝ දිවුරුම් ප්‍රකාශයක් මගින් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙකුට බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා වූ බලපත්‍රයක් නිකුත් නොකළ යුතු අතර, එසේ ලබා ගැනීමට ද හිමිකම් නොමැත්තේ ය. බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තන්

8. (1) යම් පරිශ්‍රයක බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙකු විසින්ම :- බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම

(අ) තමා නීති විරෝධී හෝ යම් අනීතික ක්‍රියාවක් සිදු නොකළ බවට හා එවැනි යම් ක්‍රියාවකට හෝ නොකර හැරීමකට වරදකරු වී නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් හා

(ආ) මෙම ප්‍රඥප්තියේ 44(1) වගන්තියේ විධිවිධාන පරිදි සකස් කරන ලද සාධන පත්‍රයක් හා

(ඇ) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය හවුල් ව්‍යාපාර හිවිසුම, සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කළ සහතිකය ද සමග ඉල්ලුම් පත්‍රයක් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) බඩු උකස් ගන්නෙකු විසින් බඩු උකස් ගැනීමේ ව්‍යාපාරික මධ්‍යස්ථාන එකකට වැඩි සංඛ්‍යාවක් හෝ එහි ශාඛා මධ්‍යස්ථාන එකකට වැඩි සංඛ්‍යාවක් පවත්වාගෙන යනු ලබන්නේ නම් එකී එක් එක් මධ්‍යස්ථානය සඳහා හෝ එකී ශාඛා මධ්‍යස්ථාන සඳහා වෙන් වෙන්ව ආදායම් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියට සාරානුකූලව ඉල්ලුම් පත්‍රයක් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) බලපත්‍රලාභියෙකු විසින් කරගෙන යනු ලබන උකස් ව්‍යාපාරයකට අනුගාමී ලිත් වර්ෂය සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රය, පවත්නා බලපත්‍රය අවලංගු වීමට නියමිත දිනයට මාස 02කට ප්‍රථම ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) උකස් ව්‍යාපාරයක් කරගෙන යාමට අදාළ බලපත්‍රය සඳහා වන පළමු ඉල්ලුම් කිරීම, එම උකස් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා වන පළමු ලියාපදිංචි කිරීම වන අතර, ඒ සඳහා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන රෙගුලාසියක් මගින් කලින් කල නියම කරන ලද මුදලක් ලියාපදිංචි ගාස්තුව ලෙස ගෙවිය යුත්තේ ය. ඊට අතිරේක 10(2) වන උප වගන්තිය යටතේ නියම කර ඇති මුදලක් 10(3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව තැන්පත් කළ යුතු ය.

(4) වාර්ෂික බලපත්‍රය නියමිත දිනට අළුත් නොකර බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබූ උකස් ගන්නකු වෙත වාර්ෂික බලපත්‍රය නිකුත් කරන්නේ නම්, බලපත්‍රයක් නොමැතිව බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන ගිය සෑම වර්ෂයක් සඳහාම අදාළ බලපත්‍ර ගාස්තුව ද, බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාරය පවත්වාගෙන ගිය සෑම මාසයක් සඳහාම අදාළ බලපත්‍ර ගාස්තුවෙන් 10%ක් බැගින් වූ ප්‍රමාද ගාස්තුවක් ද අය කළ යුතු ය. නියමිත දිනට බලපත්‍රය ලබා නොගැනීම

බලපත්‍රයක් ලබා නොමැතිව ව්‍යාපාරය පවත්වාගෙන යාම

(5) වාර්ෂික බලපත්‍රයක් ලබා නොගෙන බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබූ උකස් ගන්නෙකු වෙත වාර්ෂික බලපත්‍රය නිකුත් කරන්නේ නම් බලපත්‍රයක් නොමැතිව බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන ගිය සෑම වර්ෂයක් සඳහා ම අදාළ බලපත්‍ර ගාස්තුව ද, බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාරය පවත්වා ගෙන ගිය සෑම මාසයක් සඳහා ම අදාළ බලපත්‍ර ගාස්තුවෙන් 50%ක් බැගින් වූ ප්‍රමාද ගාස්තුවක් ද අය කළ යුතු ය.

(6) ඉල්ලුම්කරු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මෙම ප්‍රඥප්තියේ හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසිවල සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබේ නම් හා නුසුදුසුකම් නොමැතිනම් ආදායම් කොමසාරිස්වරයා බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(7) යම් තැනැත්තකු විසින් බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය කරගෙන යාමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට, බලපත්‍රය නිකුත් නොකිරීම පිළිබඳව තම තීරණය හේතු සහිතව දින 30ක් ඉකුත් වීමට ප්‍රථම ආදායම් කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්කරු වෙත දැන්විය යුතු ය.

ප්‍රධාන ලේකම්ට අභියාචනා කිරීම

(8) ඉහත 8(4) සහ 8(5) වගන්තියන්හි සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපාරය පවත්වාගෙන යන තැනැත්තාට, තමන්ට සිදුවී ඇති යම් අසාධාරණයක් පිළිබඳ ප්‍රධාන ලේකම්වරයා වෙත දින 14ක් ඇතුළත ලිඛිත කරුණු දැක්වීමක් කළ හැකිය. ඒ සම්බන්ධව ප්‍රධාන ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

බලපත්‍රයක් ලබා ගැනීමේදී වාර්ෂික ගිණුම් ඉදිරිපත් කළ යුතු බව

9. යම් ලිත් වර්ෂයක් සඳහා බලපත්‍රයක් ඉල්ලා සිටින බඩු උකස් ගන්නෙකු ස්වකීය උකස් බඩු ව්‍යාපාරයට අදාළ ඊට ආසන්නතම මුදල් වර්ෂයේ වාර්ෂික ගිණුම් ආදායම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු ය.

ඇතැම් තැනැත්තනට බලපත්‍ර නිකුත් කිරීම තහනම් කිරීම

10 (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුකොටගෙන බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යෑම තහනම් වන යම් තැනැත්තෙකුට, බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වූ බලපත්‍රයක් නියමිත දිනයේ දී හෝ ඉන්පසු නිකුත් නොකළ යුතු අතර, ප්‍රමාද දෝෂයක් නිසා හෝ එවැනි යම් තැනැත්තෙකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක්, ඒ අනුව ශූන්‍ය හා බලරහිත ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

බලපත්‍රය නිකුත් කිරීමට පෙර ඇප තැබිය යුතු බව

(2) නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකළ යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තුව සහ බලපත්‍රලාභියකු විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් හා තැන්පත් කළ යුතු ආකාරය සම්බන්ධ අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ කලින් කළ පළ කරනු ලබන රෙගුලාසියක් මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය.*

බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම

(3) ආදායම් කොමසාරිස්වරයා විසින් තැන්පත් කරන ලෙසට බලපත්‍රලාභියා වෙත දන්වනු ලබන ඇප මුදල හෝ ඇප මුදල් ආදායම් කොමසාරිස්වරයා නමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කරනු ලැබිය යුතු අතර, ව්‍යාපාරය වසා දැමීමේදී හෝ පැවරීමේදී හැර තැන්පත් මුදලින් හා/හෝ ඊට අදාළ පොලී මුදල තැන්පත්කරුට ආපසු ගෙවනු නොලැබිය යුතු ය. එසේ වුවද, බලපත්‍රලාභියා විසින් භාණ්ඩ උකස්කරුවකු හෝ උකස්කරුවන් වෙත කිසියම් මුදලක් ගෙවිය යුතු වේ නම් එම මුදල, තැන්පත් මුදලින් හා පොලී මුදලින් අඩුකර ගනු ලැබිය යුතු ය.

11. (1) (අ) යම් තැනැත්තෙකු බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා බලපත්‍රයක් නිකුත් කරන ලෙස ඉල්ලීමක් කරන දිනයට පෙරාතුවම වූ අවුරුදු 05 තුළ කවර හෝ අවස්ථාවක දී දණ්ඩ නීති සංග්‍රහයේ XI, XIII, XVII හෝ XVIII වන පරිච්ඡේද යටතේ හා/හෝ මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ දඬුවම් පැමිණ විය හැකි යම් වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම් හා/හෝ ;

(ආ) යම් තැනැත්තෙකු වෙත මෙම ප්‍රඥප්තිය යටතේ හෝ උකස් බඩු ආඥාපනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මෙම ප්‍රඥප්තියේ 12 වන වගන්තිය යටතේ අවලංගු කර තිබේ නම් හා හෝ ;

(ඇ) 13 වගන්තියේ (2) වන උප වගන්තියේ ප්‍රකාර ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ නම පළ කරනු ලැබූ තැනැත්තෙකු වන්නේ නම් හෝ ;

(ඈ) 9 වන වගන්තිය යටතේ වාර්ෂික ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කරනු නොලබන්නේ නම් හෝ ;

(ඉ) 8 වන වගන්තියේ විධිවිධාන පරිදි ඉදිරිපත් කළ යුතු ලේඛන ඉදිරිපත් කරනු නොලබන්නේ නම් හා/හෝ ;

(ඊ) වෙන්දේසිකරුවෙකු වන්නේ නම් ; හෝ

එවැනි යම් තැනැත්තෙකුට බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාර කරගෙන යෑම සඳහා වූ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

12 (1) 4 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලද බලපත්‍රයක් දරන යම් තැනැත්තෙකු එම බලපත්‍රය වලංගු කාලය තුළ බඩු උකස් ගන්නෙකු වශයෙන් ස්වකීය ව්‍යාපාරය හා සම්බන්ධව මෙම ප්‍රඥප්තිය හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවා ඇති රෙගුලාසිවලට පටහැනිව ක්‍රියාකර ඇති බවට ආදායම් කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නේ නම් එම බලපත්‍රය අවලංගු කළ හැක්කේ ය. බලපත්‍රය අවලංගු කිරීම.

එසේ වුව ද, බලපත්‍රය අවලංගු කිරීමට ප්‍රථම බලපත්‍රලාභියාට ඒ බව දන්වනු ලැබිය යුතු අතර, එයට එරෙහිව කරුණු දැක්වීමට දෙසතියක කාලයක් ලබා දිය යුතු ය.

(2) පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් අයෙකුට එම තීරණය සම්බන්ධ එක් මාසයක් ඇතුළත ප්‍රධාන ලේකම්වරයාට අභියාචනා කළ හැක්කේ ය. ඒ සම්බන්ධව තම තීරණය ප්‍රධාන ලේකම්වරයා විසින් මාස 03ක් ඇතුළත අභියාචකට දැනුම් දිය යුතු ය.

(3) බඩු උකස් ගන්නෙකු හෝ ඔහු නොසිටි අවස්ථාවකදී ඔහුගේ යම් සේවකයෙකු හෝ නියෝජිතයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් හෝ, ඔහුගේ ව්‍යාපාරයේදී කරන ලද යම් වංචාවක් සම්බන්ධයෙන් හෝ සොර බඩු බව දැන දැනම සොර බඩු භාරගැනීම හා සම්බන්ධයෙන් හෝ වරදකරු කරනු ලැබූ විට, ආදායම් කොමසාරිස්වරයා විසින් එම බඩු උකස් ගන්නාගේ බලපත්‍රය අවලංගු කළ යුතු ය.

(4) 4 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන යම් තැනැත්තකු එම බලපත්‍රය වලංගු කාලය තුළ බඩු උකස් ගන්නකු වශයෙන් ස්වකීය ව්‍යාපාරය හා සම්බන්ධව මෙම ප්‍රඥප්තිය හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවා ඇති රෙගුලාසියක් කඩකර ඇති බවට ආදායම් කොමසාරිස්වරයා සෑහීමකට පත්වන්නේ නම් එම බලපත්‍රය අත්හිටුවීමේ බලය කොමසාරිස්වරයා සතු ය.

13. (1) වාර්ෂික බලපත්‍රලාභී සෑම බඩු උකස් ගන්නෙකුගේම නම, ව්‍යාපාර නාමය සහ එම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ලිපිනය ; බලපත්‍රලාභීන්ගේ නම හා ලිපිනය ගැසට් පත්‍රයේ සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කළ යුතු බවට දැන්වීම

(2) පහත 39 වගන්තිය යටතේ වරදකරු කරනු ලබන සෑම අවස්ථාවකදීම එම තැනැත්තාගේ නම, පෞද්ගලික ලිපිනය, ව්‍යාපාර නාමය, ව්‍යාපාරය පවත්වාගෙන ගිය ස්ථානයේ ලිපිනය ද, යම් බලපත්‍රලාභියෙකුගේ බලපත්‍රය වලංගු කාලය ඉක්ම ගොස් තිබේ නම් සහ අනුගාමී වර්ෂයකට බලපත්‍රයක් නිකුත් නොකරන ලද්දේ නම්, හෝ

ආදායම් කොමසාරිස්වරයා විසින් රජයේ ගැසට් පත්‍රයේ සහ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පුවත්පත්වල දැන්වීමක් පළ කළ යුතු ය.

## V පරිච්ඡේදය

### බලපත්‍රධාරීන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි

14. තුන් මසකට වැඩි කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමට අදහස් කරන සෑම බඩු උකස් ගන්නෙකු විසින් ම :- බඩු උකස් ගන්නෙකු ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින විට ඒ බව දැන්වීම

(අ) එසේ බැහැරව යාම පිළිබඳව පළාත් ආදායම් කොමසාරිස්ට ලිඛිතව දැනුම් දිය යුතු ය. තව ද :

(ආ) තමා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින කාලය තුළ බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරයේ තමාගේ වැඩ කටයුතු කරගෙන යෑම සඳහා සහ තමා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යෑමට මෙම ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තෙකු නම් කර, ඒ පිළිබඳව පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය.

*ව්‍යාපාර කටයුතු වේලාවන්*

15. බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම පෙ. ව. 8.00ට පෙර හෝ ප. ව. 8.00 පසුව බඩු උකසට ගැනීම සිදු නොකළ යුතු ය.

*බඩු උකස් ගන්නෙකු වෙන්දේසිකරුවෙකු වශයෙන් ක්‍රියා නොකළ යුතු බව*

16. බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන තැනැත්තෙකු විසින් වෙන්දේසිකරුවෙකු වශයෙන් ක්‍රියාකිරීම හෝ වෙන්දේසිකරුවෙකුගේ ව්‍යාපාරය කරගෙන යෑම නොකළ යුතු ය.

*බඩු උකස් ගන්නන් විසින් දැන්වීම ආදිය ප්‍රදර්ශනය කර තැබිය යුතු බව*

17. සෑම බඩු උකස් ගන්නෙකු විසින්ම :

(අ) තමාගේ ව්‍යාපාර ස්ථානයේ ඉදිරිපස දොරටුවට ඉහළින් පැහැදිලි අකුරෙන් තම ව්‍යාපාරයේ නම, බඩු උකස් ගන්නෙකු ලෙස ලියාපදිංචි බලපත්‍ර අංකය සහ "බඩු උකස්ගන්නා" යන වචන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ලියා ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

(ආ) තම ව්‍යාපාර ස්ථානයට පැමිණෙන සෑම පුද්ගලයෙකුටම පෙනෙන පරිදි හා ඒ සෑම පුද්ගලයෙකු විසින් කියවිය හැකි වන පරිදි, මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති විස්තර අඩංගු දැන්වීමක්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ඒ ව්‍යාපාර ස්ථානයේ ප්‍රකට ව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

*විස්තර ඇතුළත් කිරීම සඳහා භාවිතා කළ යුතු භාෂාව*

18. බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන තැනැත්තෙකු විසින් යම් පොතක, ආකෘති පත්‍රයක හෝ ලේඛනයක යම් විස්තර ඇතුළත් කිරීමට මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති අවස්ථාවක, එම විස්තර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම අදාළ ලේඛනවල ඇතුළත් කළ යුතු ය.

*උකස් ගන්නන් විසින් පවත්වාගෙන යා යුතු පොත්*

19. මෙහි පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති "ආ" ආකෘතිය අනුව ඔඩපන පොතක් හා "ඇ" ආකෘතිය අනුව ඔඩපන විකුණුම් පොතක්, සෑම බඩු උකස් ගන්නෙකුම විසින් පවත්වාගෙන යා යුතු අතර, එම පොත් තම ව්‍යාපාරයෙහිලා පාවිච්චි කළ යුතු ය. තවද ඇතුළත් කිරීමට ඒ ආකෘතිවල විධිවිධාන සලස්වා ඇති සියළු විස්තර කලින් කල ඇතුළත් කළ යුතු වන අවස්ථාවලදී මනා ලෙසත් පැහැදිලි ලෙසත් ඒවායේ ඇතුළත් කළ යුතු අතර ඒ කාලය සඳහා අවශ්‍ය සියළු විමසීම් ද ඔහු විසින් කළ යුතු ය.

*උකස් තුණ්ඩු*

20. (1) සෑම උකස් තුණ්ඩුවක්ම මෙහි පළමුවන උපලේඛනයේ "ඇ" ආකෘතියෙහි දක්වා ඇති පරිදි මුල් පත්‍රිකාවකින් හා උප පත්‍රිකාවකින් යුක්තව ද, එම ආකෘතියෙහි ඇතුළත් නියමයන්ට අනුකූලව ද ලියා අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) දෙවන උපලේඛනයේ සඳහන් විස්තර සෑම උකස් තුණ්ඩුවකම මුල් පිටපතේ පසුපිටෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කියවිය හැකි සේ මුද්‍රණය කර තිබිය යුතු ය.

(3) ඔඩපනයක් උකස් කරනු ලබන අවස්ථාවක එම ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ සඳහන් මුදලේ වටිනාකම නියමිත මුද්දර ඇලවිය යුතු ය. එම මුද්දර සැපයීම සඳහා යන වියදම් බඩු උකස් ගන්නා විසින් දැරිය යුතු ය.

(4) (අ) බඩු උකස්කරන්නා විසින් උකස් තුණ්ඩුවේ උප පත්‍රිකාව අත්සන් කළහොත් මිස සහ අත්සන් කරන තෙක් ද ;

(ආ) බඩු උකස් ගන්නා විසින් උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව අත්සන් කොට, එය බඩු උකස් කරන්නාට දුනහොත් මිස සහ දෙන තෙක් ද, පිළිගන්නා තෙක් ද ;

(ඇ) බඩු උකස් කරන්නා විසින් උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව බඩු උකස් ගන්නාගෙන් ලබා ගෙන ඔහු එය පිළිගතහොත් මිස ;

(ඈ) වාර්ෂික පොලිය උකස් තුණ්ඩුවේ සඳහන් කරනු ලැබුවහොත් මිස ;

කිසිම භාණ්ඩයක් උකසට ගැනීමක් සිදු නොවන අතර, උකසට ගත්තාක් මෙන් නොසැලකිය යුතු ය.

21. කිසිම බඩු උකස් ගන්නෙකු විසින් ඔඩපනයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන්, දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණය ඉක්මවන පොළියක් අය නොකළ යුතු ය. පොළී ප්‍රමාණය

එසේ වුව ද, ඔඩපනයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් පිරිවැටුමින් යම් කිසි බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක, බඩු උකස් ගන්නා විසින් එම බද්ද බඩු උකස් කරන්නාගෙන් අය කර ගැනීම, මෙම වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල ඇතුළත් කිසිවකින් තහනම් නොකෙරෙන ලෙස නොසැළකිය යුතු ය.

මෙම වගන්තියේ "ඔඩපනය" යන්නට, උකස් කරන ලද්දා වූ ද, නියමිත දිනයට පෙර නිදහස් නොකරන ලද්දා වූ ද ඔඩපනයන් ඇතුළත් වේ.

## *VI* වන පරිච්ඡේදය

## ඔඩපන

22. සෑම ඔඩපනයක්ම, එය උකස් කරන ලද දින සිට එළඹෙන මාස 24ක්, (මෙම ප්‍රඥප්තියේ මින් මතු "නිදහස් කර ගැනීමේ කාලය" යනුවෙන් සඳහන් කරනු ලබන කාලය) තුළ දී නිදහස් කර ගනු ලැබිය යුතු වන්නේ ය. උකස් කළ දිනය අත් හැර මේ කාලය ගණන් බලනු ලැබිය යුතු ය. මාස විසිහතරක් තුළ ඔඩපන නිදහස් කළ යුතු බව

23. මෙම ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, සෑම ඔඩපනයක්ම, එය නිදහස් කළ යුතු කාල සීමාව ඉකුත්ව ගොස් තිබුණේ වුවද මේ ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එය බැහැර කරනු ලබන තෙක්, සෑම උකස්කරුවකුටම ඔඩපනය නිදහස් කර ගනු ලැබිය හැකි වන්නේ ය.

24. (1) යම් ඔඩපනයකට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව බඩු උකස් කරන්නා විසින් බඩු උකස් ගන්නාට බාර දී, බඩු උකස් ගන්නා හෝ ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා හෝ ඉදිරියේදී එම මුල් පත්‍රිකාව අත්සන් කොට, තම අනන්‍යතාව ඔප්පු කළහොත් එම ඔඩපනය නිදහස් කර ගැනීමේ හිමිකම එම උකස්කරුට ඇත්තේ ය. ඔඩපනයක් නිදහස් කර ගැනීමේ ක්‍රියා මාර්ගය.

(2) බඩු උකස් කරන්නෙකු නොවන යම් පුද්ගලයෙකු විසින් යම් ඔඩපනයකට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව ඒ ඔඩපනය උකස් කළ තැනැත්තාගේ අත්සනින් යථා පරිදි පිටසන් කරවාගෙන උකස් කරු වෙත ඉදිරිපත් කළ හොත් සහ ඒ තැනැත්තා විසින් බඩු උකස් ගන්නා හෝ ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා ඉදිරියේදී එම මුල් පත්‍රිකාව අත්සන් කළහොත් සහ තම අනන්‍යතාවය ඔප්පු කර සිටියහොත් එම ඔඩපනය නිදහස් කර ගැනීමේ හිමිකම් ඒ තැනැත්තාට ඇත්තේ ය.

(3) බඩු උකස්කරන්නාගේ මරණය නිසා හෝ අශක්තතාව නිසා හෝ එම ඔඩපනය නිදහස් කර ගැනීමේ හිමිකම ඇති එම ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව දරන තැනැත්තා විසින් කියා සිටින්නා වූ ද, එසේත් බඩු උකස් කරන්නාගේ අත්සනින් යථා පරිදි පිටසන් කරවාගෙන උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වන්නා වූ ද, අවස්ථාවක, එකී දරන්නා විසින් සහ ඔහුගේ අනන්‍යතාවයට සාක්ෂි දරන්නා විසින් මෙහි පළමුවන උපලේඛනයේ "ඉ" ආකෘතිය අනුව සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු ඉදිරියේදී යථා පරිදි කරන ලද ප්‍රකාශයක් ද සමග එකී ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව එකී දරන්නා විසින් බඩු උකස් ගන්නා වෙත ඉදිරිපත් කළහොත්, එම ඔඩපනය නිදහස් කර ගැනීමට එකී මුල් පත්‍රිකාව දරන තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

(4) ඉහත (1), (2), (3) උප වගන්තිවල විධිවිධානවලට යටත්ව, ඔඩපනය මත ගෙවිය යුතු ණය සහ ඊට අයවිය යුතු පොළිය ද, ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු බදු වේ නම් එම බද්ද ගෙවූ විට බඩු උකස් ගන්නා විසින්, අවස්ථෝචිත පරිදි, එකී ඔඩපනය හා සම්බන්ධ උකස් තුණ්ඩුව ඉදිරිපත් කරන බඩු උකස් කරන්නා වෙත හෝ එම තුණ්ඩුව දරන්නා වෙත එම ඔඩපනය භාරදිය යුතු ය. ඔඩපනය එසේ භාරදීම සම්බන්ධයෙන් බඩු උකස්ගන්නාට මෙයින් ආරක්ෂාව සළසනු ලැබේ.

(5) එසේ වුවද උකස් තුණ්ඩුව දරන්නා, එය සොරකම් කර හෝ අන්‍යාකාරයකින් නීති විරෝධීව එහි සන්තකය ලබා ගෙන හෝ ඇති බවට සැක කිරීමට බඩු උකස් ගන්නෙකුට හේතු ඇත්නම් බඩු උකස් ගන්නා විසින් ඒ පුද්ගලයා සහ උකස් තුණ්ඩුවේ එකී උකස් ව්‍යාපාරය පිහිටි ප්‍රාදේශීයේ පොලිස් ස්ථානාධිපතිවරයා වෙත හෝ ග්‍රාම නිලධාරී වෙත හැකිතාක් ඉක්මණින් භාරදිය යුතු ය. ග්‍රාම නිලධාරී වෙත භාරදෙන ලද පුද්ගලයෙක් නම් ග්‍රාම නිලධාරී විසින් හැකි ඉක්මනින් එම උකස් නීති විරෝධී ලෙස උකස් තුණ්ඩු තමා භාරයේ තබා ගැනීම

ව්‍යාපාරය පිහිටි පොලිස් ස්ථානය වෙත උකස් තුණ්ඩුව ද සමග එකී පුද්ගලයා භාරදිය යුතු ය. කුමන ආකාරයකින් හෝ පොලිස් ස්ථානාධිපති වෙත භාරදෙනු ලැබූ යම් පුද්ගලයෙකු හා උකස් තුණ්ඩුව ඔහු විසින් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**ඔඩපනයේ වටිනාකම අඩුකිරීම සම්බන්ධයෙන් වන්දි**

25. ඔඩපනයක් බේරා ගැනීමට හිමිකම ඇත්තා වූ ද, එය බේරා ගැනීමට ඉදිරිපත් වන්නා වූ ද, තැනැත්තෙකු විසින් එම ඔඩපනය උකස් කරනු ලැබූ අවස්ථාවේදී එහි පැවති වටිනාකම, බඩු උකස් ගන්නාගේ වරදක්, නොසැළකිලිමත්කමක් හෝ ඕනෑකමින් ම සිදු කළ විෂම චර්යාවක් මගින් හෝ ඒ සියල්ල හේතුකොටගෙන හෝ අඩු වී තිබෙන බව නැතහොත් වටිනාකම අඩුවීමට සලස්වා තිබෙන බවට නිසි අධිකරණ බලය ඇති සිවිල් අධිකරණයකට, එම අධිකරණය සෑහීමකට පත් වන පරිදි පෙන්වා දුනහොත්, සුදුසුයැයි ඒ අධිකරණය අදහස් කරන්නේ නම්, ඒ ඔඩපනයේ අයිතිකරු සෑහීමකට පත්වන පරිදි යුක්ති සහගත වන්දියක් ඒ අධිකරණය විසින් ප්‍රදානය කළ හැකිය. එසේ ප්‍රදානය කරන ලද වන්දි ප්‍රමාණය බඩු උකස් ගන්නාට ගෙවිය යුතු මුදලින් අඩු කළ යුතු ය. එසේ නැතහොත් අධිකරණය විසින් නියම කරන ලද වෙනත් ආකාරයකට බඩු උකස් ගන්නා විසින් ඒ වන්දිය ගෙවිය යුතු ය.

**උකස් තුණ්ඩු නොමැති බඩු අයිතිකරුවන්ට සහ උකස් කරන්නන්ට ආරක්ෂාව**

26. (1) තමා යම් ඔඩපනයක අයිතිකරු බව කියා සිටින, එහෙත් උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව නොදරන යම් තැනැත්තෙකු විසින් හෝ, උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව දැරීමට තමාට හිමිකම් තිබේ යැයි ද, එනමුත් එම තුණ්ඩුවේ මුල් පත්‍රිකාව නැති වී, සොරකම්කර, අස්ථානගත වී, විනාශ වී හෝ කිසිවෙකු වංචනික ලෙස තමාගෙන් ලබාගෙන හෝ ඇතැයි ද කියා සිටින යම් තැනැත්තෙකු විසින් මෙහි පළමුවන උපලේඛනයේ "ඊ" ආකෘතියට අනුව සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේදී තමාද, තමාගේ අනන්‍යතාවයට සාක්ෂි දරන තැනැත්තා ද විසින් යථා පරිදි කරනු ලැබූ ප්‍රකාශයක් බඩු උකස් ගන්නා වෙත භාරදෙනු ලැබූ විට ඒ උකස් තුණ්ඩුවේ මුල්ම පත්‍රිකාව ඒ තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබූ කල්හි හිමිවන සියළු අයිතිවාසිකම් හා ප්‍රතිකර්ම ඔහු හා බඩු උකස් ගන්නා ද අතර ඇති වන්නේ ය.

එසේ වුවද, ඔඩපනයක් බේරා ගැනීමේ කාර්යය සඳහා ඔහු විසින් අත්සන් කළ යුතු වන්නේ 20 වන වගන්තියේ නියමිත උකස් තුණ්ඩුවේ උප පත්‍රිකාවය.

(2) ඉහත සඳහන් ප්‍රකාශය, එහි අඩංගු යම් වැදගත් තොරතුරක් සම්බන්ධයෙන් වංචනික හෝ ව්‍යාජ හෝ බවට, සත්‍ය හෝ අනුමිත හෝ දැන්වීමක් බඩු උකස් ගන්නාට ලැබී නැත්නම්, ඔඩපනය භාරදීම හෝ එම ප්‍රකාශය අනුව වෙනත් ආකාරයකින් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් වන 26.(1) හි දක්වා ඇති වගකීමෙන් බඩු උකස් ගන්නා මෙයින් ආරක්ෂා කරනු ලැබේ.

**ඔඩපනය නිදහස් කර ගැනීමෙන් හෝ විකිණීමෙන් හෝ පසු උකස් තුණ්ඩු බඩු උකස් ගන්නා විසින් තබා ගත යුතු බව.**

27. (1) ඔඩපනයක් නිදහස් කර ගැනීමේ කාර්යය සඳහා උකස් තුණ්ඩුවක මුල් පත්‍රිකාව බඩු උකස් ගන්නා වෙත භාර දෙනු ලැබූ අවස්ථාවක එම ඔඩපනය නිදහස් කර ගත් දින සිට ගණන් ගනු ලබන මාස 24ක කාලයක් ඉකුත් වන තෙක් බඩු උකස් ගන්නා විසින් එම උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව හා උප පත්‍රිකාව තමන් සන්තකයේ තබා ගත යුතු ය.

(2) ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව භාර නොදී, එම ඔඩපනය නිදහස් කරගනු ලැබූ අවස්ථාවක, එම ඔඩපනය නිදහස් කරගත් දින සිට ගණන් ගනු ලබන මාස 24ක කාලයක් ඉකුත් වන තෙක් එම ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ උප පත්‍රිකාව සහ එම නිදහස් කර ගැනීමේ කාර්යය සඳහා 26(1) වන උප වගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද ප්‍රකාශය බඩු උකස් ගන්නා විසින් තම සන්තකයේ තබා ගත යුතු ය.

(3) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ඔඩපනයක් විකුණන ලද අවස්ථාවක, ඒ ඔඩපනයට අදාළ උකස් තුණ්ඩුවේ උප පත්‍රිකාව, එකී විකිණීම කළ දින සිට ගණන් ගනු ලබන මාස 24ක කාලයක් ඉකුත් වන තෙක් බඩු උකස් ගන්නා විසින් තමා සන්තකයේ තබා ගත යුතු ය.

**බඩු උකස් ගන්නන් විසින් තබා ඇති ඇප මුදල් යෙදවීම හා ආපසු ගෙවීම**

28. (1) යම් ඔඩපනයක් යම් බඩු උකස්ගන්නකු වෙත උකස් කර තිබියදී එම ඔඩපනයක් නැති වූ අවස්ථාවක දී, බඩු උකස් කරන්නාට හෝ එම ඔඩපනය නිදහස් කර ගැනීමට හිමිකම් ඇති වෙනත් යම් තැනැත්තෙකුට හෝ එම ඔඩපනයේ වර්තමාන වෙළඳ වටිනාකම ඒ භාණ්ඩ උකස්ගත් තැනැත්තා විසින් තබා ඇති ඇප මුදලින් ගෙවිය යුතු ය.

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ ගෙවනු ලබන මුදල 10(2) වන උප වගන්තිය අනුව තබා ඇති ඇප මුදලින් අඩුවන ප්‍රමාණය උකස් ගන්නා විසින් ඇපයක් වශයෙන් නැවත ගෙවිය යුතු ය. (1) වන උප වගන්තිය යටතේ ගෙවිය යුතු මුදල තබා ඇති ඇප මුදල ඉක්මවා යන්නේ නම්, උකස්කරන්නාට හෝ එම ඔඩපනය නිදහස්කර ගැනීමට හිමිකම් ලබන අය වෙත ගෙවීම පිණිස එසේ ඉක්මවන මුදල් ප්‍රමාණය ගෙවිය යුතු ය. ඊට අමතරව 10(2) වන උප වගන්තියේ සඳහන් ඇප මුදල ද තැන්පත් කළ යුතු ය.

*උකස සිලව් කිරීම හා ව්‍යාපාරයේ ගණන් බේරා නිදහස් කිරීම.*

(3) යම් තැනැත්තකු විසින් බඩු උකස් ගන්නෙකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යෑම අත්හරින ලද අවස්ථාවක දී ඔහු විසින් තබා ඇති ඇප මුදලින් සහ උපචිත පොළියෙන් (1) වන උප වගන්තියෙන් සඳහන් මුදල ගෙවීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් වේ නම් එම මුදල අඩු කරගෙන ඉතුරු මුදල ඒ බඩු උකස් ගන්නාට ගෙවිය යුතු ය.

*ව්‍යාපාරය ඇවර කර ගණන් බේරා වසා දමනු ලබන විට එහි වගකීම නිරවුල් කිරීම. ඇප පොළිය රඳවාගෙන ඉතිරිය උකස්කරුට ගෙවීම.*

29. (1) ගින්නෙන් හෝ ස්වභාවික ආපදාවක් හෝ කුමන හෝ වෙනත් උපද්‍රවයක් හේතුකොටගෙන ඔඩපනයක් විනාශ වූ හෝ ඔඩපනයකට හානි වූ අවස්ථාවක උකස නිදහස් කළ හැකි කාල සීමාව ඇතුළත ඉල්ලා සිටිනු ලැබුවහොත් ණය මුදල සහ පොළිය ද ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු යම් බද්දක් හෝ වේ නම් එම බද්ද ද අඩු කර ඔඩපනයේ වටිනාකම බඩු උකස් ගන්නා විසින් ගෙවිය යුතු ය.

*ගින්නක් ඇති වුවහොත් එවිට උකස්ගන්නාගේ බැඳීම.*

30. (1) සෑම බඩු උකස් ගන්නෙකු ම තමා වෙත උකස් කරනු ලැබ ඇති භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම හා ඉදිරියේදී උකස් වශයෙන් ලබා ගැනීමට අදහස් කරන සියළුම ඔඩපන හා භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම දක්වා තම ව්‍යාපාරය පූර්ණ වගකීමක් සහිත වූ රක්ෂණයකින් ආවරණය වන පරිදි රක්ෂණය කළ යුතු ය.

*රක්ෂණ ආවරණයක් ලබා ගත යුතු ය.*

(2) උකස්ගන්නා ලද භාණ්ඩ එහි ප්‍රමිතියට හානි නොවන සේ ආරක්ෂිතව ගබඩා කර තැබීමට විධිමත් පරිදි පියවර ගෙන තිබීම උකස් ගන්නාගේ සම්පූර්ණ වගකීම වේ.

31. ඔඩපනයක් නිදහස් කරන වේලාවේදී, බඩු උකස් ගන්නෙකු වෙත ආපසු ගෙවන ලද ණය මුදල සහ පොළී මුදල ද, අදාළ වෙනත් බදු අයකර ගන්නා ලද්දේ නම් එම බදු සඳහා ලදුපතක් සෑම බඩු උකස්ගන්නෙකු විසින්ම නිකුත් කළ යුතු අතර, එම ලදුපතේ පිටපතක් 'උ' ආකෘතියට අනුව තබාගත යුතු ය.

*බඩු උකස් ගන්නාගේ ලදුපත*

32. (1) උකස නිදහස් කළ හැකි කාල සීමාව ඇතුළත නිදහස් කර ගනු නොලබන සෑම ඔඩපනයක්ම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් බැහැර කරනු ලැබිය හැකි නමුත් වෙනත් ආකාරයකින් බැහැර කරනු නොලැබිය යුතු ය. තවද තුන්වන උපලේඛනයේ සඳහන් නියෝග එම විකිණීමේ දී පිළිපැදිය යුතු ය.

*ඔඩපන වෙන්දේසියේ විකිණිය හැකි බව.*

(2) මෙම වගන්තියේ පෙරාතුව ම වූ විධිවිධාන යටතේ ඔඩපනයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යන විට එම ඔඩපනය උකස් කර ඇත්තේ යම් බඩු උකස්ගන්නකු වෙත ද ඒ බඩු උකස් ගන්නා විසින් එම වෙන්දේසියේ විකිණීම පැවැත්වීමට නියමිත දිනය හා වේලාව ද එම වෙන්දේසියේ විකිණීම පැවැත්වීමට නියමිත ස්ථානය පිළිබඳ මූලික දැන්වීමක් යටත් පිරිසෙයින් දින 60කට කලින් අවසර ලබා ගැනීම පිණිස පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු ය. එම දැන්වීම ලැබී දින 15ක් ඉකුත්වීමෙන් පසුව පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් තම තීරණය, වෙන්දේසිය පැවැත්වීමට අවසර ලබාදුන් දිනයට දින 21කට පෙර උකස්කරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

*විකිණීම පිළිබඳ දැන්වීම*

(3) මෙම ප්‍රඥප්තිය යටතේ යම් බඩු උකස් ගන්නෙකු ඔඩපනයක් විකිණීමට ඇති අවස්ථාවක දී එම ඔඩපනය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයාගෙන් අවසර ලබාගෙන ඇති එකී දිනය වේලාව සහ වෙන්දේසිය සිදු කරනු ලබන ස්ථානය පිළිබඳ දැන්වීමක් එම දිනට යටත් පිරිසෙයින් දින 14කට ප්‍රථම බඩු උකස් ගන්නා විසින් එම ඔඩපනය උකස් කළ තැනැත්තාට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතු ය.

ණය පොලිය සහ පිරිවැටුම් බද්දක් හෝ අදාළ වෙනත් බද්දක් ඉක්මවන මුදලකට ඔඩපනය විකිණීමක දී කාර්ය පරිපාටිය.

33. (1) මෙම ප්‍රඥප්තිය යටතේ ඔඩපනයක් වෙන්දේසියේ විකුණනු ලැබූ සෑම අවස්ථාවකදීම, එම ඔඩපනය මත දෙන ලද ණය මුදල හා එම ඔඩපනය වෙන්දේසියේ විකුණන දිනය දක්වා එම ණය මුදල වෙනුවෙන් අය විය යුතු පොළිය ද, ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු යම් බද්දක් වේ නම් එම බද්ද ඉක්මවන මුදලකට එම ඔඩපනය වෙන්දේසියේ විකුණනු ලැබූ විට, බඩු උකස් ගන්නා විසින්,

(අ) ඔඩපනය වෙන්දේසියේ විකුණනු ලැබූ මුදල කොපමණ ද යන්නත්, වෙන්දේසියේ විකිණීම සඳහා අවශ්‍යයෙන් දරන වියදම් සහ ගාස්තු අඩු කිරීමෙන් පසු බඩු උකස්කරන්නාගේ බැරට ඇති මුදල කොපමණ ද යන්නත්, එම ඔඩපනය උකස්කරුට නොපමාව දැනුම් දිය යුතු ය. තවද,

31 වගන්තිය යටතේ දැනුම් දීමේ පිළිවෙල

(ආ) ඉහත දැන්වීම ලද දිනයේ සිට එක් අවුරුදු කාල සීමාවක් ඇතුළත එකී බැරට ඇති මුදල් උකස් කළ තැනැත්තා විසින් ඉල්ලා සිටියහොත්, එම උකස්කරුට එම මුදල ගෙවිය යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ විධාන පරිදි එකී අවුරුද්දක කාලසීමාව ඇතුළත, උකස්කරු විසින් එකී බැරට ඇති මුදල ඉල්ලා තම හිමිකම් පානු නොලැබුවහොත් එම කාලසීමාව ඉකුත් වූ වහාම එම මුදල් පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත පළාත් සභා අරමුදලට බැර කිරීම සඳහා භාර කළ යුතු ය.

උකස් කරන්නාගේ බැරට පළාත් සභාවේ තැන්පත් කර ඇති මුදල්.

34. (1) ආදායම් කොමසාරිස්වරයා විසින් 33 වැනි වගන්තියේ විධිවිධාන අනුව යම් මුදලක් උකස් කරන්නෙකුගේ බැරට තැන්පත් කරන ලද අවස්ථාවක දී ඒ බව උකස් කරන්නා වෙත නොපමාව දන්වා යැවිය යුතු ය.

(2) ආදායම් කොමසාරිස්වරයා විසින් (1) වන උප වගන්තිය යටතේ යවන ලද දැන්වීමක් තමා වෙත ලැබුණු දිනයේ සිට වසර 02ක් ඇතුළත බලපත්‍රලාභියාගේ දැන්වීමෙහි සඳහන් මුදල තමාට ගෙවන ලෙස ආදායම් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද්දේ නම් එම මුදල එකී ඉල්ලීම ලැබී දින 30ක් ඇතුළත එම තැනැත්තා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(3) (2) වන උප වගන්තිය යටතේ වසර 02ක කාලයක් ඇතුළත ඉල්ලීමක් ඉදිරිපත් කරනු නොලැබුවහොත්, උකස් කරන්නෙකු වෙත ගෙවිය යුතුව තිබූ මුදල ආදායම් කොමසාරිස්වරයා විසින් පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

බඩු උකස් ගන්නා විසින් ඔඩපන මිළට ගැනීම.

35. බඩු උකස් ගන්නෙකු වෙත උකස් කර තිබුණු ඔඩපනයක් මෙම ප්‍රඥප්තිය යටතේ පවත්වනු ලබන හෝ පවත්වනු ලබන්නේ යැයි සැලකෙන ප්‍රසිද්ධ වෙන්දේසියකදී, ඒ උකස් ගන්නා විසින් ලංසු තබා මිළට ගනු ලැබිය හැකිය. එසේ මිලට ගනු ලැබූ පසු ඔහු ඒ මිලට ගන්නා ලද ඔඩපනයෙහි පරම අයිතිකරු ලෙස සලකනු ලැබේ.

## *VII පරිච්ඡේදය*

### *අවේක්ෂණය, පරීක්ෂණය සහ තහනමට අල්ලා ගැනීම*

විකුණුම් පොත් හා ගිණුම් අවේක්ෂණය කිරීමේ බලය

36. (1) ඔඩපනයක් මෙම ප්‍රඥප්තිය යටතේ විකුණන ලද දින සිට අවුරුදු 02ක් ඇතුළත, කවර විටෙක වුව ද බඩු උකස් ගන්නාගේ පොතෙහි එම විකිණීම පිළිබඳව කර ඇති සටහන සහ වෙන්දේසිකරු විසින් තම අත්සන යොදා සහතික කරන ලද එම වෙන්දේසිය පිළිබඳ තොරතුරු ඇතුළත් කළ නාමාවලියෙහි කර ඇති සටහන් හෝ එම දෙකෙන් කවර වුව ද සටහනක් උකස් තුණ්ඩුව දරන්නා විසින් අවේක්ෂණය කළ හැකි අතර, එම විකිණීම සම්බන්ධයෙන් එම පොතෙහි හා නාමාවලියෙහි හෝ එම දෙකෙන් එකක හෝ ඇතුළත් සටහන් අවේක්ෂණය කිරීමට බඩු උකස් ගන්නා විසින් එම උකස් තුණ්ඩුව දරන්නාට අවසර දිය යුතු ය.

(2) පළාත් ආදායම් කොමසාරිස්වරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය පවරන ලද නියෝජ්‍ය කොමසාරිස්වරයෙකුට සහ/හෝ තක්සේරුකරුවෙකුට බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරයට අයත් ගිණුම් පරීක්ෂා කිරීමට බලය ඇත්තේ ය.

උකස්කරු විසින් තමන් සහ උකස් කරනු ලබන භාණ්ඩ පිළිබඳ නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකරන විට ගත යුතු ක්‍රියා මාර්ග

37. යම් බඩු උකස් කරන්නෙකු ,

(1) උකස් තැබීම සඳහා යම් භාණ්ඩයක් උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කිරීමේදී තම ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය ඉදිරිපත් නොකරන්නේ නම් සහ/හෝ

(2) උකස් තැබීම සඳහා යම් භාණ්ඩයක් බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරයිද, එහෙත් තමාට එම භාණ්ඩය ලැබුණේ කෙසේද යන්න සතුටුදායක විස්තරයක් කිරීම ප්‍රතික්ෂේප කිරීම සහ/හෝ එවැනි විස්තරයක් කිරීමට අපොහොසත් වෙයි ද නැතහොත් ; සහ/හෝ

(3) උකස් තැබීම සඳහා බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරන භාණ්ඩයක් තමාගේ ම දේපළක් ද නැද්ද යන්න පිළිබඳව හෝ ඔහුගේ නම හා ලිපිනය පිළිබඳව හෝ හිතාමතාම අසත්‍ය තොරතුරු සපයයිද, නැතහොත් ; සහ/හෝ

(4) නිදහස් කර ගැනීමට හිමිකමක් නොමැති ඔඩපතය නිදහස් කර ගැනීමට උත්සාහ හෝ වෑයම් කරයිද, නැතහොත් ; සහ/හෝ

(5) යම් බඩුවක් උකස් තැබීම සඳහා බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කළ විට එම බඩුව සොරකම් කරන ලද හෝ වෙනත් ආකාරයකින් නීති විරෝධී ලෙස ලබා ගන්නා ලද හෝ බඩුවක් බව සැක කිරීමට හේතු ඒ බඩු උකස්ගන්නාට තිබේ ද ;

යන ඉහත කී කරුණු සැලකිල්ලට ගැනීමේ දී යුක්තිසහගත සහ සාධාරණ සැකයක් ඉහත කී කරුණු සැලකිල්ලට ගැනීමේ දී පවතී නම්, උකස් ගන්නා විසින් එකී භාණ්ඩ උකස් කරන්නා සහ එම ඔඩපතය හා උකස් තුණ්ඩුව අල්ලා රඳවා තබාගෙන හැකිතාක් ඉක්මණින් පොලිස් නිලධරයකුට හෝ ග්‍රාම නිලධරයකුට හෝ භාර දිය යුතු ය. ග්‍රාම නිලධාරී වෙත භාරදෙන ලද පුද්ගලයෙක් නම් ග්‍රාම නිලධාරී විසින් හැකි ඉක්මණින් එම උකස් ව්‍යාපාර පිහිටි පොලිස් ස්ථානය වෙත එම ඔඩපතය හා උකස් තුණ්ඩුව ද සමග එකී පුද්ගලයා භාරදිය යුතු ය. කුමන ආකාරයකින් හෝ පොලිස් ස්ථානාධිපති වෙත භාරදෙනු ලැබූ යම් පුද්ගලයෙකු, ඔඩපතය හා උකස් තුණ්ඩුව ඔහු විසින් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත ඉදිරිපත් කළ යුතු ය.

බඩු උකස් ගන්නකුගේ සාප්පුව හෝ ව්‍යාපාරස්ථානය සෝදිසි කිරීමේ බලය.

38. ආදායම් කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධාරියෙකු හෝ කණ්ඩායමක් විසින් යම් බඩු උකස් ගන්නෙකුගේ සාප්පුවට හෝ ව්‍යාපාර ස්ථානයකට හෝ දිවා කාලයේ යම් වේලාවක ඇතුළු වී, එම බඩු උකස් ගන්නා වෙත ඔඩපතය කර තිබෙන යම් ඔඩපතයක් හෝ ඔහු පවත්වාගෙන යන පොත් හෝ ලියවිලි පරීක්ෂා කර අවශ්‍ය සටහන් ලියා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ සඳහා පොලිස් නිලධාරියෙකුගේ සහාය අවශ්‍ය බව ආදායම් කොමසාරිස් තීරණය කරනු ලබන්නේ නම් එම පොලිස් නිලධාරියා සමග ගොස් ඉහත ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉටු කළ හැකිය. ඉහත කාර්යය ඉටු කිරීමේදී කිසිදු තැනැත්තකු විසින් එම නිලධාරියාට හෝ කණ්ඩායමට ප්‍රතිරෝධ නොදැක්විය යුතු ය.

## *VIII වැනි පරිච්ඡේදය*
## *වැරදි සහ දණ්ඩන*

බඩු උකස් කරන්නන් හා වෙනත් තැනැත්තන් කරන වැරදි

39. (1) උකස් කිරීම සඳහා යම් බඩුවක් උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරන, එහෙත් තමාට එහි සන්තකය ලැබුණේ කෙසේ ද යන්න පිළිබඳව සතුටුදායක විස්තරයක් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ ඊට අපොහොසත් වන ;

(2) උකස් කිරීම සඳහා බඩු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කරන යම් භාණ්ඩයක් තමාගේම දේපළක් ද නැද්ද යන්න සම්බන්ධයෙන් හෝ තමාගේ නම හා ලිපිනය සම්බන්ධයෙන් හෝ ඒ භාණ්ඩයේ අයිතිකරුගේ නම හා ලිපිනය සම්බන්ධයෙන් හෝ හිතාමතාම අසත්‍ය තොරතුරු ඒ බඩු උකස්ගන්නා වෙත සපයන ;

(3) වෙනත් තැනැත්තෙකුගේ දේපළක් වන යම් භාණ්ඩයක් නීත්‍යානුකූලව නිදහසට කරුණක් නොමැතිව, බඩු උකස් ගන්නෙකු වෙත උකස් කරන ;

(4) නිදහස් කර ගැනීමට හිමිකමක් නොමැති ඔඩපතය නිදහස් කර ගැනීමට උත්සාහ කරන තැනැත්තෙකු;

(5) යම් උකස්කරුවෙකු භාණ්ඩයක් උකස් කිරීම සඳහා බදු උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කළ විට එම භාණ්ඩය සොරකම් කරන ලද හෝ වෙනත් ආකාරයකින් නීතිවිරෝධී ලෙස ලබා ගන්නා ලද හෝ භාණ්ඩයක් බව සැක කිරීමට හේතු ඒ බදු උකස්ගන්නාට ඇති විට ; හා ඒ සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු දැන දැනම ප්‍රකාශ කරන විට ;

(6) මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් කඩ කරන හෝ ප්‍රඥප්තියෙන් කළ යුතු යැයි නියම කරන ලද දෙයක් කිරීම පැහැර හරින ;

සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන්නේ ය.

බදු උකස් ගන්නන් විසින් කරනු ලබන වැරදි

40\. (1) (අ) වයස අවුරුදු දහසයකට අඩුබව හා/හෝ බීමත්ව සිටින බව හා/හෝ පෙනෙන යම් තැනැත්තෙකුගෙන් යම් භාණ්ඩයක් උකස්ගන්නා ;

(ආ) උකස් තුණ්ඩුවේ මුල් පත්‍රිකාව උකස්කරුට භාර නොදී භාණ්ඩයක් උකස් ගන්නා ;

(ඇ) වෙනත් බදු උකස්ගන්නකු විසින් නිකුත් කරන ලද උකස් තුණ්ඩුවක මුල් පත්‍රිකාව මිළට ගන්නා හෝ උකස් ගන්නා හෝ හුවමාරු කරන ;

(ඈ) වයස අවුරුදු දහ අටට අඩු සේවකයකු භාණ්ඩයක් උකස් ගැනීම සඳහා සේවයෙහි යොදවන ;

(ඉ) තමා වෙත උකස් කර තිබෙන ඔඩපනයක් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියකදී හැර මිළට ගන්නා ;

(ඊ) තමා වෙත උකස් කර ඇති ඔඩපනයක් තමා විසින් මිළ දී ගැනීමේ අදහසින් නිදහස් කර ගැනීමට ඉඩ සලස්වන ;

(උ) තමා වෙත උකස් කරන ලද ඔඩපනයක් හෝ උකස් කිරීමට ඉදිරිපත් කරනු ලබන යම් භාණ්ඩයක්, එය නිදහස් කර ගනු ලැබීමට ඉඩ දී ඇති කාලය තුළ දී මිළට ගැනීමට, විකිණීමට හෝ බැහැර කිරීමට යම් තැනැත්තකු සමග එකඟත්වයට පැමිණෙන ;

(ඌ) තමා වෙත උකස් කරන ලද ඔඩපනයක් හෝ උකස් කිරීමට ඉදිරිපත් කරන ලද යම් ඔඩපනයක් හෝ භාණ්ඩයක් එය නිදහස් කර ගැනීමේ කාලය තුළ දී මිළට ගැනීමට, විකිණීමට හෝ බැහැර කිරීමට යම් තැනැත්තෙකු සමග එම භාණ්ඩය උකස් කරන තැනැත්තා හෝ උකස් කිරීමට ඉදිරිපත් කරන තැනැත්තා සමග එකඟත්වයට පැමිණෙන ;

(එ) තමා වෙත උකස් කොට ඇති යම් ඔඩපනයක්, මෙම ප්‍රඥප්තියේ බලය දී ඇති ආකාරයට හැර, විකුණන හෝ වෙනත් ආකාරයකින් බැහැර කරන ;

(ඒ) පවත්වාගෙන යා යුතු යයි මෙම ප්‍රඥප්තියෙන් තමාට නියමිත යම් පොතක අසත්‍ය සටහනක් කරන හෝ එහි ඇතුළත් කළ යුතු යැයි මෙම ප්‍රඥප්තියෙන් තමාට නියමිත යම් සටහනක් ඇතුළත් කිරීම පැහැර හරින ;

(ඔ) යම් යුක්තිසහගත හේතුවක් හෝ සාධාරණ හේතුවක් හෝ නොමැතිව 22 වන වගන්තියේ නැතහොත් 24(5) වන උපවගන්තිය විධිවිධාන යටතේ යම් තැනැත්තකු අල්ලා ගන්නා හෝ රඳවා ගන්නා ;

(ඕ) තමා වෙත උකස් කර තිබෙන හා ඉදිරියේදී උකස් වශයෙන් ලබා ගැනීමට අදහස් කරන සියළුම ඔඩපන සහ භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම දක්වා තම ව්‍යාපාරය පූර්ණ වගකීමක් සහිත වූ රක්ෂණයකින් ආවරණය කර ගැනීම පැහැර හරින ;

(ක) මෙම ප්‍රඥප්තිය යටතේ යම් විධිවිධානයක් කඩ කරන හෝ කල යුතු යැයි මෙම ප්‍රඥප්තියේ තමාට නියමිත යම් දෙයක් කිරීම පැහැර හරින ;

(ග) පළාත් ආදායම් කොමසාරිස්වරයාගෙන් විධිමත් බලපත්‍රයක් ලබා නොගෙන බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ;

(ත) මෙම ප්‍රඥප්තියේ 06 වැනි වගන්තියේ විධිවිධාන පරිදි ආදායම් කොමසාරිස්වරයා වෙත වාර්ෂික ගිණුම් වාර්තාවක් ඉදිරිපත් නොකරන ;

(ත) මෙම ප්‍රඥප්තියේ කවර විධිවිධානයක් හෝ උල්ලංඝනය කරන ;

සෑම උකස් ගන්නෙකුම වරදකට වරදකරු වන්නේ ය.

ඇතැම් අවස්ථාවලදී රෙදිපිළි, ඇඳුම් හා නොනිමි භාණ්ඩ ආදිය උකස් ගැනීම තහනම් බව.

41. සේදීමට, ශුද්ධ කිරීමට, මැදීමට, අළුත් වැඩියා කිරීමට, නිෂ්පාදනය කිරීමට, වැඩ දැමීමට, නිමහම් කිරීමට හෝ අලංකාර කිරීමට යම් තැනැත්තකුට දෙන ලදැයි දන්නා රෙදිපිළි හෝ නිම නොකළ භාණ්ඩ හෝ ද්‍රව්‍ය කිසිවක් දැන දැනම උකස් ගන්නා සෑම බඩු උකස් ගන්නෙක් ම වරදකට වරදකරුවෙක් වන්නේ ය. යම් අධිකරණයක් විසින් යම් උකස් බඩු ගන්නකු මේ වගන්තිය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ විට එම වරද සඳහා ඒ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව ඒ ඔඩපනය අධිකරණය ඉදිරිපිට දී හෝ අධිකරණය විසින් විධානය කරනු ලබන වෙනත් ආකාරයකට හෝ එහි අයිතිකරුට භාර දෙන ලෙස ඒ බඩු උකස් ගන්නාට ඒ අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය.

බඩු උකස්ගන්නන් විසින් කරනු ලබන වැරදි

42. යම් උකස්කරුවෙකුගේ බැරට ඇති මුදල 33(1) ඇ වගන්තියෙන් නියම කර ඇති ආකාරයට පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත තැන්පත් කිරීම පැහැර හරින සෑම බඩු උකස් ගන්නෙකුම වරදකට වරදකරු වන අතර යම් අධිකරණයක් විසින් යම් උකස් බඩු ගන්නෙකු ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට ඒ වරද සඳහා අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව එකී මුදලට සමාන මුදලක් දඩයක් අයකරගන්නා ආකාරයෙන් ඒ බඩු උකස් ගන්නා ගෙන් අයකර ගැනීමට ඒ අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය. ඒ සෑම මුදලක් ම අධිකරණය විසින් අයකර ගනු ලැබූ කල්හි එම මුදල් උකස් කරන්නාගේ බැරට පළාත් සභා අරමුදලට තැන්පත් කරනු ලැබිය යුතු ය.

බඩු උකස්ගන්නෙකුගේ සේවකයකු හෝ නියෝජිතයකු විසින් කරනු ලබන වැරදි.

43. බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යෑමේදී හෝ ඊට සම්බන්ධව හෝ එම බඩු උකස්ගන්නාගේ සේවකයා නැතහොත් ඔහුගේ නියෝජිතයා විසින් කරනු ලැබූ හෝ කිරීම පැහැර හරිනු ලැබූ හෝ යම් කාර්යයක් අවස්ථාවෝචිත පරිදි එම බඩු උකස්ගන්නා විසින් කරනු ලැබූ හෝ කිරීම පැහැර හරිනු ලැබූ හෝ කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුවද, බඩු උකස් ගන්නෙකු ඔහුගේ සාප්පුවේ හෝ ව්‍යාපාර ස්ථානයේ හෝ නොසිටියදී එම බඩු උකස් ගන්නාගේ යම් සේවකයකු හෝ නියෝජිතයකු හෝ විසින් මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් කඩවන පරිදි යම් කාර්යයක් කරන ලද්දේ නම් හෝ එසේ කිරීම පැහැර හරින ලද්දේ නම්, එම සේවකයා හෝ නියෝජිතයා වරදකට වරදකරු වන්නේ ය.

දණ්ඩන

44 (1) මෙම ප්‍රඥප්තිය යටතේ වදරකට වරදකරු වන සෑම තැනැත්තෙක්ම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ කරනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විටක, රුපියල් 200,000කට නොවැඩි දඩයකට හෝ හය මසකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාරය ගත කිරීම යන දෙකින් ම හෝ ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය. මෙම උප වගන්තිය යටතේ අධිකරණය විසින් අය කරනු ලබන සෑම මුදලක්ම පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

(2) වාර්ෂික බලපත්‍රයක් ලබා නොගෙන උකස් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන උකස් ගන්නෙකුට (1) වන උප වගන්තිය යටතේ දක්වා ඇති දණ්ඩනවලට අමතරව අයවීමට ඇති හිඟ වාර්ෂික බලපත්‍ර ගාස්තු සහ හිඟ වාර්ෂික බලපත්‍ර ගාස්තුවලින් 10%කට සමාන මුදලක් දඩයක් ලෙස අය කර ගැනීමට අධිකරණය විසින් නියෝග කරනු ලැබිය යුතු ය.

(3) වාර්ෂික බලපත්‍රය අළුත් නොකර උකස් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන උකස් ගන්නෙකුට (1) වන උප වගන්තිය යටතේ දක්වා ඇති දණ්ඩනවලට අමතරව අයවීමට ඇති හිඟ වාර්ෂික බලපත්‍ර ගාස්තු සහ හිඟ වාර්ෂික බලපත්‍ර ගාස්තුවලින් 10% සමාන මුදලක් දඩයක් ලෙස අයකර ගැනීමට අධිකරණය විසින් නියෝග කරනු ලැබිය යුතු ය. මෙම උප වගන්තිය යටතේ අධිකරණය විසින් අය කරනු ලබන සෑම මුදලක්ම පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

(4) ඉහත (1) වන උපවගන්තිය යටතේ දණ්ඩනයකට අමතරව 40 වන වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ විට එම වරද සඳහා එම අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව, එම ඔඩපනය අධිකරණය ඉදිරිපිටදී හෝ අධිකරණය විසින් විධානය කරනු ලබන වෙනත් ආකාරයට හෝ එකී අයිතිකරුව භාරදෙන ලෙස එම බඩු උකස් ගන්නාට ඒ අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(5) ඉහත (1) වන උප වගන්තිය යටතේ දණ්ඩනයකට අමතරව 41 වැනි වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ විට එම වරද සඳහා එම අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව එකී මුදලට සමාන මුදලක, දඩයක් අයකර ගන්නා ආකාරයෙන් ඒ බඩු උකස් ගන්නාගෙන් අයකර ගැනීමට එම අධිකරණය විසින් නියෝග කරනු ලැබිය යුතු ය. ඒ සෑම මුදලක්ම අධිකරණය විසින් අයකර ගනු ලැබූ කල්හි, එම මුදල් පළාත් සභා අරමුදල භාරයේ තැන්පත් කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උප වගන්තිය සඳහන් දණ්ඩනවලට අමතරව උකස් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය වසා දැමීම සඳහා නියෝගයක් ලබා දීමට අධිකරණය වෙත බලය ඇත්තේ ය.

බඩු උකස්ගන්නකුගේ සන්තකයෙහි නීති විරෝධීව තබාගෙන ඇති බඩු.

45. යම් බඩු උකස් ගන්නෙකුගේ සන්තකයෙහි යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ කිහිපයක් නීතිවිරෝධීව තබාගෙන ඇති බව මෙම ප්‍රඥප්තිය යටතේ පවත්වාගෙන යනු ලබන නඩු කටයුත්තකදී, යම් අධිකරණයකට වාර්තා කරනු ලබන කවර හෝ අවස්ථාවකදී, එම භාණ්ඩ හෝ භාණ්ඩය අධිකරණයට ඉදිරිපත් කරන ලෙස ද, සුදුසු යැයි ඒ අධිකරණය විසින් සළකනු ලබන නියමත් කිසිවක් ඇතොත් එම නියමයන් යටතේ ඒ අධිකරණය විසින් නම් කරනු ලබන යම් තැනැත්තකුට එම භාණ්ඩය හෝ භාණ්ඩ භාර දෙන ලෙස ද, නියම කිරීමේ බලය එම අධිකරණයට ඇත්තේ ය.

## *IX වැනි පරිච්ඡේදය*
## *ව්‍යාපාරය පැවරීම හා අවසන් කිරීම*

බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේදී ව්‍යාපාරය පැවරිය යුතු තැනැත්තා සම්බන්ධයෙන් සාධන පත්‍රයක් ඉදිරිපත් කළ යුතු බව.

46. (1) බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය තනි පුද්ගලයකු විසින් පවත්වාගෙන යනු ලබන්නේ නම් එකී පුද්ගලයාගේ මරණින් පසුව එකී ව්‍යාපාරය පැවරීමට අදහස් කරන්නේ නම් එම තැනැත්තා සමග බැඳීම් ඇතුළත් සාධන පත්‍රයක් සකස් කොට බලපත්‍රය සඳහා ලියාපදිංචියට ඉල්ලුම් කරන අවස්ථාවේ දී එකී සාධන පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. එසේ වුවද එකී තැනැත්තාට බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා මේ ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා දීමට සුදුසුකම් ලත් අයකු විය යුතු ය.

(2) බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරයක් තනි පුද්ගලයකු විසින් පවත්වාගෙන යනු ලබන අවස්ථාවකදී එකී පුද්ගලයාගේ මරණින් පසුව ව්‍යාපාරය පැවරිය යුතු තැනැත්තන් මිය ගොස් ඇති අවස්ථාවකදී එකී මිය ගිය පුද්ගලයන් වෙනුවට වෙනත් තැනැත්තන් සමග අත්සන් කරනු ලබන බැඳීම් ඇතුළත් සාධන පත්‍රයක් ආදායම් කොමසාරිස්වරයා වෙත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන උප වගන්තිය යටතේ පැවරීමක් සිදුකොට නොමැති අවස්ථාවකදී හෝ පැවරීම සඳහා නම් කළ තැනැත්තා ඊට අදාල සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අවස්ථාවකදී ව්‍යාපාරය ඇවර කිරීම සඳහා යම් තැනැත්තෙකු ආදායම් කොමසාරිස්වරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) බඩු උකස් ගන්නෙකුගේ යම් දුබලතාවයක් හේතුවෙන් හෝ වෙනත් හේතුවක් නිසා හෝ උකස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට නොහැකි අවස්ථාවක ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මෙම ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් සහිත පුද්ගලයෙක් බව ආදායම් කොමසාරිස්වරයා විසින් සෑහීමට පත්වන අයෙකු වෙත සාධන පත්‍රයක් මගින් එකී ව්‍යාපාරයේ වත්කම් සහ බැරකම් පවරනු ලැබිය හැක්කේ ය.

එසේ පවරා දෙනු ලැබූ විටෙක ආදායම් කොමසාරිස්වරයා නිකුත් කොට වලංගුව පවතින වාර්ෂික බලපත්‍රය, එකී උකස් ව්‍යාපාරයේ වත්කම් හා බැරකම් පවරා දෙනු ලැබූ තැනැත්තාට නිකුත් කළ බලපත්‍රයක් සේ සැළකිය යුතු ය.

තවද එම පැවරීම සිදු කළ දින සිට එකී තැනැත්තා එම ව්‍යාපාරය සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ දක්වා ඇති සියලුම නියමයන් ට යටත් වන්නේ ය.

(5) උකස් ව්‍යාපාරයක් හවුල්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන විට එම ව්‍යාපාරය අවසන් කිරීමේ දී උකස්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි විධිවිධාන ඇතුළත් කර තිබිය යුතු ය. හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි ඒ පිළිබඳව විධිවිධාන ඇතුළත් කර නොමැති බව කොමසාරිස්වරයාගේ මතය වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතුය.

47\. (1) උකස් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන යම් තැනැත්තෙක් එම ව්‍යාපාරය පැවරීමට අදහස් කරන්නේ නම් පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත තුන් මසකට පෙර ලිඛිතව ඉල්ලීමක් කළ යුතු ය. ව්‍යාපාරය පැවරීම

(අ) (1) වන උප වගන්තිය යටතේ යම් තැනැත්තෙකුට ආදායම් කොමසාරිස්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් කළ විට එදින සිට දින 07ක් ඇතුළත තම ව්‍යාපාරය පැවරීමට අදහස් කරන තැනැත්තාගේ නම සහ ලිපිනය ජාතික හැඳුනුම්පත් අංකය සහිතව ප්‍රසිද්ධ දැන්වීමක් ව්‍යාපාර ස්ථානයේ සහ දිනපතා පළ වන පුවත්පත්වල තෙවු භාෂාවෙන් ප්‍රසිද්ධ කළ යුතු ය.

(ආ) ව්‍යාපාරය පැවරීම සඳහා වන ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට, ආදායම් කොමසාරිස්වරයා විසින් ලිපිය ලැබී දින 07ක් තුළ-

(i) එම ව්‍යාපාරයේ බඩු උකස් ගැනීම නිශ්චිතව සඳහන් දිනයක සිට නතර කරන ලෙස

(ii) උකස්ගන්නාට හා පැවරුම්ලාභියාට එරෙහිව පැමිණිලි කිසිවක් නොමැති බවට ව්‍යාපාරය පිහිටි පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිගෙන් හා එම තැනැත්තන් ස්ථිර පදිංචි ප්‍රදේශය අයත් පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිගෙන් සහතිකයක් ඉදිරිපත් කරන ලෙස ;

(iii) උකස්ගන්නාට හා පැවරුම්ලාභියාට එරෙහිව අධිකරණයේ නඩු කටයුත්තක් නොමැති බවට දිවුරුම් ප්‍රකාශනයක් ඉදිරිපත් කරන ලෙසට ;

(iv) නිදහස් කිරීමට ඇති සියළු ඔඩපන පිළිබඳ හා අවශ්‍ය යැයි සළකනු ලබන අනෙකුත් තොරතුරු ඉදිරිපත් කරන ලෙස ;

(v) පැවරුම්ලාභියා අදාළ ව්‍යාපාරය තමා භාරයට පවරාගත් දින සිට මෙම ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි කටයුතු කරන බවට ඔහුගෙන් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස, උකස් ගන්නා වෙත ලිඛිතව දැනුම්දීම කළ යුතු ය.

(ඇ) මෙම වගන්තිය යටතේ ආදායම් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කිරීමට බැඳී ඇති තැනැත්තා යම් ශාරීරික හා මානසික අශක්තතාවයට පත්ව ඇත්නම් සහ එම ව්‍යාපාරය තනි පුද්ගල ව්‍යාපාරයක් වන්නේ නම් එකී ඉල්ලීම එම තැනැත්තාගේ බලයලත් නියෝජිතයකු විසින් කරනු ලැබිය හැකිය. හවුල් ව්‍යාපාරයක් වන්නේ නම් එකී ඉල්ලීම වෙනත් හවුල්කරුවකු විසින් ද, සීමිත සමාගමක් වන්නේ නම් එකී ඉල්ලීම වෙනත් අධ්‍යක්ෂවරයෙකු හෝ ලේකම් විසින් කරනු ලැබිය යුතු ය.

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ උකස් ව්‍යාපාරයක් පැවරීම සඳහා ඉල්ලීමක් ආදායම් කොමසාරිස්වරයා වෙත ලැබූ දින සිට ලිත් මාස 03ක් ඇතුළත තම තීරණය එකී තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

48\. (1) උකස් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන යම් තැනැත්තෙක් එම ව්‍යාපාරය අවසන් කිරීමට අදහස් කරන්නේ නම් පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත තුන් මසකට පෙර ලිඛිතව ඉල්ලීමක් කළ යුතු ය. ව්‍යාපාර අවසන් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තෙකු ආදායම් කොමසාරිස්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් කළ විට එදින සිට දින 07ක් ඇතුළත තම ව්‍යාපාරය අවසන් කරන බවට අදාළ තැනැත්තාගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය සහ උකස් ව්‍යාපාරයේ බලපත්‍ර අංකය සහිතව ප්‍රසිද්ධ දැන්වීමක් ව්‍යාපාර ස්ථානයේ සහ දිනපතා පළවන පුවත්පත්වල තෙභාෂාවෙන් ප්‍රසිද්ධ කළ යුතු ය.

(අ) ව්‍යාපාරය අවසන් කිරීම සඳහා වන ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට, ආදායම් කොමසාරිස්වරයා විසින් ලිපිය ලැබී දින 07ක් ඇතුළත-

(i) එම ව්‍යාපාරයේ බඩු උකස් ගැනීම නිශ්චිතව සඳහන් දිනයක සිට නතර කරන ලෙස

(ii) උකස්ගන්නාට එරෙහිව පැමිණිලි කිසිවක් නොමැති බවට ව්‍යාපාරය පිහිටි පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිගෙන් හා එම තැනැත්තන් ස්ථිර පදිංචි ප්‍රදේශය අයත් පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිගෙන් සහතිකයක් ඉදිරිපත් කරන ලෙස

(iii) උකස්ගන්නාට එරෙහිව අධිකරණයේ නඩු කටයුත්තක් නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙසට

(iv) නිදහස් කිරීමට ඇති සියළු ඔඩපන පිළිබඳ හා අවශ්‍ය යැයි සළකනු ලබන අනෙකුත් තොරතුරු ඉදිරිපත් කරන ලෙසට

(v) අවසන් ඔඩපනය නිදහස් කළ යුතු දිනය තෙක් ව්‍යාපාර කටයුතු කරනු ලබන බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස

උකස්ගන්නා වෙත ලිඛිතව දැනුම් දීම කළ යුතු ය.

(ආ) මෙම වගන්තිය යටතේ ආදායම් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කිරීමට බැඳී ඇති තැනැත්තා යම් ශාරීරික හා මානසික අශක්නුතාවයට පත්ව ඇත්නම් සහ එම ව්‍යාපාරය තනි පුද්ගල ව්‍යාපාරයක් වන්නේ නම් එකී ඉල්ලීම එම තැනැත්තාගේ බලයලත් නියෝජිතයකු විසින් කරනු ලැබිය හැකිය. හවුල් ව්‍යාපාරයක් වන්නේ නම් එකී ඉල්ලීම වෙනත් හවුල්කරුවකු විසින් ද, සීමිත සමාගමක් වන්නේ නම් එකී ඉල්ලීම වෙනත් අධ්‍යක්ෂවරයෙකු හෝ ලේකම් විසින් කරනු ලැබිය යුතු ය.

(3) ඉහත (1) වන උපවගන්තිය යටතේ උකස් ව්‍යාපාරයක් අවසන් කිරීම සඳහා ඉල්ලීමක් ආදායම් කොමසාරිස්වරයා වෙත ලැබූ දින සිට ලිත් මාස 03ක් ඇතුළත තම තීරණය එකී තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

ව්‍යාපාරයේ අයිතිකරු මියයාම

49. 1. මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කළ බලපත්‍රයක් යටතේ උකස් ව්‍යාපාරයක් කරගෙන ගිය යම් තැනැත්තෙකු මිය ගිය අවස්ථාවක, ඒ තැනැත්තාගේ මරණය සිදුවීමට පෙරාතුවම වූ සියළුම කාල සීමාවන් සම්බන්ධයෙන් ඒ තැනැත්තා ජීවත්ව සිටියේ නම්, ඔහු විසින් ගෙවිය යුතුව තිබූ ගාස්තු, මුදල් පොල්මෑකරු විසින් ගෙවිය යුතු අතර, මේ ප්‍රඥප්තිය යටතේ වගකිව යුතු වූ සියළු ක්‍රියා කාරණා හා දේවල් සම්බන්ධයෙන් පොල්මෑකරු වගකිව යුතු ය.

එසේ වුව ද,

(අ) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් පොල්මෑකරුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

(ආ) ඒ තැනැත්තාගේ මරණය සිදුවූ දිනයට පෙරාතුව වූ කාල පරිච්ඡේදයන් සම්බන්ධයෙන් ඔහුගෙන් අයවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් ඔහු මිය ගිය දින සිට වර්ෂ 03ක් ඉකුත් වූ පසුව එම මුදල් ගෙවන ලෙස පොල්මෑකරුට නියම නොකළ යුතු ය.

(ඇ) මේ වගන්තිය යටතේ පොල්මාකරුගේ වගකීම-

(i) මෙම ප්‍රඥප්තිය යටතේ යම් බැඳීමක් පැන නගින බවට පොල්මාකරුට එම දැන්වීම දෙනු ලබන දිනය වන විට ඔහු සන්තකයේ හෝ ඔහුගේ පාලනයෙහි පැවති මිය ගිය තැනැත්තාගේ මුදලයට ;
සහ

(ii) අර්ථලාභියෙකු අතට පත්ව තිබිය හැකි ඒ මුදලයේ යම් කොටසකට ප්‍රමාණයට, සීමා විය යුතු ය.

## X වන පරිච්ඡේදය
## නියෝග පැනවීම

50. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ පහත කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කලට නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග පැනවීම.

(අ) 8(3) උප වගන්තිය යටතේ උකස් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා වන ලියාපදිංචි කිරීමේ ගාස්තු ;

(ආ) 10(2) උප වගන්තිය යටතේ උකස් බලපත්‍රයක් සඳහා අය කළ යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තුව සහ බලපත්‍රධාරියා විසින් තැන්පත් කළ යුතු ඇප මුදල සහ ඇප මුදල තැන්පත් කළ යුතු ආකාරය

(2) (1) උප වගන්තිය යටතේ කරනු ලබන සෑම රීතියක්ම එය ගැසට් පත්‍රයේ පළ කරන ලැබූ දිනයේ සිට හෝ ඒ රීතියෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු අතර, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට හැකිතාක් ඉක්මණින් එම නියමය යෝජනාවක් මගින් පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් රීතියක් ඒ ප්‍රතික්ෂේප කිරීම "දින තෙක් " ඒ රීතියේ වලංගුභාවයට හානියක් නොමැතිව ඒ ප්‍රතික්ෂේප කිරීමේ දින සිට ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලදැයි සළකනු ලැබිය යුතු අතර, ඒ රීතිය යම් දිනයකදී ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලදැයි සලකන්නේ ද ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

## *XI පරිච්ඡේදය*
## *හිඟ මුදල් අයකර ගැනීම*

51. (1) මෙම පරිච්ඡේදයේ කාර්යය සඳහා "හිඟ මුදල් " යන්නට උකස් ගන්නා විසින් ගෙවිය යුතු ඇප මුදලක් සහ හෝ 8(4)(5) වන උප වගන්ති යටතේ යම් ප්‍රමාද ගාස්තුවක් හෝ 10(3), 28(1)(2) යන උප වගන්ති හා 31 වගන්තිය යටතේ අයවිය යුතු යම් මුදලක් ඇතුළත් වේ.

(2) (1) වන උපවගන්තිය යටතේ අයවිය යුතු යම් හිඟ මුදලක් දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයකට පෙර ගෙවිය යුතු බවට උකස් ගන්නා වෙත ලියාපදිංචි තැපෑලෙන් ආදායම් කොමසාරිස් විසින් දැනුම්දිය යුතු අතර එසේ නොගෙවන ලද යම් මුදලක් පැහැර හරිනු ලැබ හිඟ මුදලක් ලෙස සලකා අය කිරීම සඳහා කටයුතු කළ යුතු ය.

(3) (අ) (2) වන උප වගන්තිය යටතේ යම් මුදලක් පැහැරහැර ඇති අවස්ථාවක මීත්මතු විධිවිධාන සලසා ඇති කවර හෝ ආකාරයකින් ඒ මුදල අයකර ගැනීමට පෙර කොමසාරිස්වරයා විසින්,

(i) හිඟ මුදල පිළිබඳ විස්තර සහ

(ii) හිඟ මුදල අයකර ගැනීම සඳහා කටයුතු කිරීමට අදහස් කරන බව

සඳහන් කරමින් පැහැර හැරි තැනැත්තා වෙත ලියවිල්ලක් හෝ දැන්වීමක් ලියාපදිංචි තැපෑලෙන් නිකුත් කළ යුතු ය.

(ආ) ඉහත 3(අ) උප වගන්තිය යටතේ ආදායම් කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද දැන්වීමක් එම තැනැත්තා වෙත ලැබුණු දින සිට සති 02ක් තුළ ඒ පිළිබඳ යම් විරෝධතාවයක් එම තැනැත්තා විසින් ඉදිරිපත් කළ හැකි අතර කොමසාරිස්වරයා විසින් එම විරෝධතාව සලකා බලා, ඒ පිළිබඳ තම තීරණය ලිඛිතව දැන්විය යුතු ය. එම තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

52. (1) මෙම ප්‍රඥප්තිය යටතේ අයවිය යුතු හිඟ මුදලක් අයකර ගැනීම සඳහා ආදායම් කොමසාරිස්වරයා විසින් හිඟ මුදල සහ ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාගේ නම ඔහු අන්තිමට පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක් ඒ ස්ථානය පිහිටි කොට්ඨාස විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කළ හැකිය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් පැහැර ඇති හිඟ මුදල අයකර ගැනීම සඳහා ඒ පැහැර හැර ඇති තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්වීමට තරම් කරුණු තිබේ නම්, ඒ කරුණු ඔහු විසින් දැක්වීම පිණිස තමා වෙත කැඳවිය යුතු ය. ඔහු ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත් පැහැර හැර ඇති හිඟ මුදල දඩයකින් පමණක් දඬුවම් කළ හැකි හෝ බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි හෝ බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් නොකළ හැකි වරදක් සඳහා ඒ පැහැර හැර ඇති තැනැත්තාට මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දණ්ඩන නියමයකින් නියම කරනු ලැබූ දඩයක් ලෙස සැළකිය යුතු අතර එවිට ඒ වරද සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීමට අදාළ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන එහි (අ) (ආ) සහ ඡේද හැර අදාළ විය යුතු ය. තවද ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ විධානයක් ද ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

(2) ආදායම් කොමසාරිස්වරයා විසින් (1) වන උප වගන්තියේ කාර්ය සඳහා නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාව ගැන මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කරනු ලැබීම නොකළ යුතු අතර, ඒ අනුව, ඒ සහතිකයෙහි ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය ගැන සලකා බැලීම හෝ තීරණය කිරීම මහෙස්ත්‍රාත්වරයාට බලය පවරන්නක් ලෙස ඒ උප වගන්තියෙහි වූ කිසිවක් තේරුම් නොගත යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ උප වගන්තිවල විධිවිධාන කිසිවක් මේ වගන්තියේ (1) වන උප වගන්තියේ සඳහන් යම් අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උප වගන්තියේ සඳහන් වන්නා වූ ද පැහැර හැර ඇති තැනැත්තාට නියම කරනු ලැබූ ලෙස ඒ උපවගන්තියෙන් සැලකෙන දඩය නොගෙවා පැහැර හැරීම නිසා, පැහැර හැර ඇති තැනැත්තා බන්ධනාගාර ගත කිරීමට නියම කරනු ලැබුවා වූ ද යම් අවස්ථාවක මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ දඩ මුදල ගෙවීමට කල්දීම හෝ ඒ මුදල කොටස් වශයෙන් ගෙවන ලෙස විධාන කිරීම හෝ කළ හැකිය.

(5) (1) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා ඒ උප වගන්ති යටතේ කල්දීම සඳහා හෝ (4) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා කල්දීම සඳහා පූර්ව කොන්දේසියක් වශයෙන් ඇප තබන ලෙස පැහැර හැර ඇති තැනැත්තාට නියම කළ විටක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(6) කොටස් වශයෙන් යම් මුදලක් ගෙවිය හැකි බවට මහෙස්ත්‍රාත්වරයෙකු විසින් (4) වන උපවගන්තිය යටතේ විධාන කරනු ලැබ තිබිය දී ඉන් යම් කොටසක් පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියළුම කොටස් ගෙවීම් පැහැර හැර ඇති විටෙක මෙන් නඩු කටයුතු ඇරඹිය හැකිය.

(7) (1) වන උප වගන්තිය යටතේ යම් නඩු කටයුත්තකදී ආදායම් කොමසාරිස්වරයාගේ සහතිකය, ගාස්තු ගෙවන ලෙස යථා පරිදි නියම කරනු ලැබූ බවට හා එය පැහැර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, ගාස්තු ප්‍රමාණය අධික බවට හෝ සාවද්‍ය බවට හෝ එයට විරුද්ධව අභියාචනා කොට ඇති බවට ඉදිරිපත් කරනු ලබන කිසිම උත්තරවාදයක් පිළිනොගත යුතු ය.

53. යම් හිඟ මුදලක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකදී සහ 52 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට එම හිඟ මුදල අයකර ගැනීම ප්‍රායෝගික හෝ යෝග්‍ය නොවන්නේ යයි කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවකදී ඒ හිඟ මුදල පිළිබඳ විස්තර ඒ හිඟ මුදල ගෙවිය යුතු

තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම හෝ නම් ඇතුළත් සහතිකයක් එකී පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ඔහුට අයත් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටා ඇති ප්‍රදේශයේ විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර එවිට ඒ හිඟ මුදල අයකර ගැනීම සඳහා අවශ්‍යයයි ඒ දිසා අධිකරණය විසින් සලකනු ලබන පරිදි පැහැර හරින්නාගේ චංචල හෝ නිශ්චල දේපළ සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ තහනමට ගෙන විකුණන ලෙස ඒ පිස්කල් නිලධාරියාට බලය දෙමින් ඇස්කිසි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසට ඒ අධිකරණය විසින් විධානය කළ යුතු ය. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එවැනි තහනමට ගැනීමකට සහ විකිණීමට අදාළ වන්නේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා චංචල දේපළ යන්නට පිරියත සහ යන්ත්‍රෝපකරණ ඇතුළත් වේ.

## *XII* පරිච්ඡේදය
## පොදු විධිවිධාන

54. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා ආදායම් කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තෙකු වෙත ලිඛිත දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් — තොරතුරු ඉල්ලා සිටීමේ බලය

i. පොත්පත්, ගිණුම්, වෙළඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර්, චෙක්පත්, උකස් කුණ්ඩු, ඔඩපත පොත්, විගණන වාර්තා හෝ ඒ තැනැත්තා සන්තකයෙහි ඇති ඒ දැන්වීමෙහි සඳහන් වෙනත් ලේඛන නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේද තුළ දී ඉදිරිපත් කරන ලෙස ;

ii. යම් තොරතුරක් සපයන ලෙස ;

iii. යම් කරුණක් හෝ කරුණු පිළිබඳ පරීක්ෂා කරනු ලැබීම සඳහා යම් ස්ථානයකට එහි සඳහන් යම් දිනයක හා වේලාවක තමාම හෝ බලයලත් නියෝජිතයෙකු මගින් හෝ පැමිණෙන ලෙස නියම කරනු ලැබිය හැකිය.

(2) යම් තොරතුරක් සපයන ලෙස නියම කරමින් ඉහත (1), iii වන උප වගන්තියේ සඳහන් යම් තැනැත්තෙකු වෙත දැන්වීමක් භාරදෙන අවස්ථාවකදී, එවැනි තොරතුරු සැපයීම වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද ඒ නොතකා ඒ තැනැත්තා විසින් ඉහත කී නියමයට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(3) ඉහත (1) වන උප වගන්තිය යටතේ ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ ඉදිරිපත් කර තිබුණා වූ හෝ වෙනත් ආකාරයකින් තම සන්තකයට පත්වන හෝ පත්ව තිබෙන යම් පොත්, ගිණුම්, වෙළඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර්, චෙක්පත්, උකස් කුණ්ඩු, ඔඩපත පොත්, විගණක වාර්තා හෝ වෙනත් ලියකියවිලි මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා තම භාරයෙහි යම් කාලයක් රඳවා ගැනීමට අවශ්‍ය වන්නේ ද ඒ කාලය සඳහා තම භාරයෙහි රඳවා ගනු ලැබිය හැකිය.

(4) තැපෑලෙන් යවනු ලබන යම් දැන්වීමක්, තැපෑලට භාර දුන් දින සිට දින 03ක් අවසන් වූ දිනයේ දී භාර දෙන ලද ලෙස සැළකිය යුතු ය.

55. මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් සඳහා නඩුවක් පැවරීම ආදායම් කොමසාරිස්වරයාගේ අනුමතය නොමැතිව නොකළ යුතු ය. — නඩු පැවරීම

56. මෙම ප්‍රඥප්තිය යටතේ කාර්යයන් ඉටුකිරීමේදී භාවිතා කළ යුතු ආකෘති පත්‍ර ආදායම් කොමසාරිස්වරයා විසින් කලින් කල නියම කළ හැකිය. එසේ නියම කරනු ලැබූ යම් ආකෘති හෝ ලේඛන කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ එසේ නියම කරනු ලැබූ යම් ආකෘති පත්‍ර හෝ ලේඛන වෙනුවට වෙනත් යම් ආකෘති හෝ ලේඛනයක් ආදේශ කිරීම කොමසාරිස්වරයා විසින් කළ හැකිය. — ආකෘති පත්‍ර සකස් කිරීම

57. මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීමෙහිලා හැර, මේ ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූ හෝ පත් කරනු ලදැයි සළකනු ලබන සෑම තැනැත්තෙකුම හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තැනැත්තෙකුට සහාය වීම සඳහා හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටි හෝ ලැබ සිටින සෑම තැනැත්තෙකු ම, මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේදී යම් තැනැත්තෙකුගේ කටයුතු පිළිබඳව තමාට දැන ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් — නිල රහස්‍යභාවය

රහස්‍යභාවය ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහිලා සහාය වීම කළ යුතු ය. තවද, ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට, අමාත්‍යවරයාට හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ ඔහුගේ බලයලත් යම් තැනැත්තෙකුට හැර එවැනි යම් කාරණයක් නොදැන්විය යුතු අතර, ආදායම් කොමසාරිස්වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තෙකුට ඉඩ හැරීම හෝ අවසරදීම හෝ නොකළ යුතු ය.

58. බදු උකස් ගන්නෙකු විසින් කළ යුතු යැයි මෙම ප්‍රඥප්තියේ නියම කර ඇති හෝ කිරීමට මෙම ප්‍රඥප්තියේ බලය දී ඇති හෝ කවර දෙයක් වුව ද බදු උකස් ගන්නාගේ අවසරය මත ඔහුගේ සේවකයා හෝ නියෝජිතයා විසින් කරනු ලැබිය හැකිය.

මේ ප්‍රඥප්තිය යටතේ බලතල ආදිය පැවරීම

59. මෙම ප්‍රඥප්තියේ සඳහන් බලතල, කාර්තව්‍ය හෝ කාර්යය කිසිවක් ආදායම් කොමසාරිස්වරයාගේ අත්සන යටතේ ලිඛිතව බලය දෙනු ලැබූ යම් නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු, තක්සේරුකරුවෙකු, රජයේ නිලධරයෙකු විසින් ක්‍රියාත්මක කරනු හෝ ඉටු කරනු ලැබිය හැක්කේ ය. මෙම ප්‍රඥප්තියේ සඳහන් ආදායම් කොමසාරිස්වරයා විසින් පවරා ඇති බලතල, කර්තව්‍යයන් හෝ කාර්යයන් කිසිවක් ආදායම් කොමසාරිස්වරයා විසින් තමා වෙත ආපසු පවරා ගනු ලැබිය හැක්කේ ය.

ඔප්පු කිරීමේ භාරය

60. භාණ්ඩ උකස් ගන්නෙකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම පිණිස වූ බලපත්‍රයක් යම් තැනැත්තෙකුට නිකුත් කිරීමේ කාර්යය සඳහා හෝ මේ ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට විරුද්ධව පවරන ලද නඩුවකදී හෝ ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන බවට හෝ විදේශීය සමාගමක් හෝ විදේශීය ව්‍යාපාර ආයතනයක් නොවන බව හෝ ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා වෙත පැවරී ඇත්තේ ය.

61. යම් භාණ්ඩ යම් කොන්දේසි මත පසුව නිදහස් කරගන්නා බවට හෝ ආපසු මිලදී ගන්නා බවට හෝ ප්‍රකාශිත හෝ ව්‍යාංගික එකඟ වීමක් හෝ පිළිගැනීමක් නැතහොත් ගනුදෙනුවෙහි ස්වරූපය හා ලක්ෂණ අනුව එවැනි එකඟ වීමක් හෝ පිළිගැනීමක් ඇතැයි යුක්ති සහගතව ව්‍යාංගික වන එකඟවීමක හෝ පිළිගැනීමක් යටතේ හෝ ඒ අනුව භාණ්ඩ මිලදී ගැනීම හෝ විකිණීම හෝ සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදල් වලට ඇප වශයෙන් භාණ්ඩ තබා ගැනීම සඳහා සාප්පුවක් පවත්වා ගෙන යාම භාණ්ඩ මිලට ගෙන හෝ භාරගෙන හෝ තබා ගෙන, ඒ වෙනුවෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවන්නා වූ හෝ අත්තිකාරම් වශයෙන් දෙන්නා වූ හෝ ණයට දෙන්නා වූ සෑම තැනැත්තෙකුම බදු උකස් ගැනීමේ ව්‍යාපාරය කරන්නෙකු ලෙස මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය. තවද ඒ සෑම ගනුදෙනුවක්ම, භාණ්ඩයක්, ගෙවීමක්, අත්තිකාරමක් සහ ණයක් ම මේ ප්‍රඥප්තිය ඇතුළත පිළිවෙලින්, උකසක්, ඔඩපනයක් සහ ණයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

62. මේ ප්‍රඥප්තියේ පටහැනිව කුමක් සඳහන් ව ඇත්ද -

(අ) (99 වැනි අධිකාරය වූ) උකස් ආඥාපනත යටතේ මධ්‍යම පළාත තුළ නිකුත් කර ඇති යම් බලපත්‍රයක් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ලෙස සැළකිය යුතු ය.

(ආ) එම ආඥාපනත යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් ඉවත්කොට මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග ඒ වෙනුවට ආදේශ කරනු ලබන තෙක් එකී නියෝග මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග ලෙස සැළකිය යුතු ය.

(ඇ) ආඥාපනත යටතේ පවරනු ලැබ නියමිත දිනයට පෙරතුවම වූ දිනය වන විට විභාගයට පාත්‍රව පැවතියා වූ යම් නඩුවක් සහ එවැනි නඩුවකදී අධිකරණයක් විසින් දෙනු ලැබූ යම් තීරණයක් අවස්ථාවෝචිත පරිදි, මේ ප්‍රඥප්තිය යටතේ පවරන ලද නඩුවක් ලෙස ද, මේ ප්‍රඥප්තිය යටතේ පවරනු ලැබූ නඩුවක දී දෙන ලද තීරණයක් ලෙස ද සළකනු ලැබිය යුතු ය.

*XIII වැනි පරිච්ඡේදය*
*අර්ථ නිරූපනය*

63. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"ප්‍රධාන ලේකම්වරයා" - මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්වරයා අදහස් වේ.

"මධ්‍යම පළාත් ආදායම් කොමසාරිස්වරයා" යන්නෙන් මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා පත්කරනු ලබන මධ්‍යම පළාත් ආදායම් කොමසාරිස්වරයා අදහස් වන අතර, 1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තියේ දී ඇති අර්ථයම ඇත්තේ ය.

"පොලිස් නිලධාරයා" යන්නෙන් ව්‍යාපාරය පිහිටි ප්‍රදේශයට අයත් පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපතිවරයා අදහස් වේ.

"නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන්නෙන් 1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තියේ දී ඇති අර්ථයම අදහස් වේ.

"තක්සේරුකරු" යන්නෙන් 1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තියේ දී ඇති අර්ථයම අදහස් වේ.

"විදේශීය සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර, එයින්-

(අ) නියමිත දිනට පසුව ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවනු ලැබ හෝ ;

(ආ) නියමිත දිනට පෙර ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා නියමිත දිනයේ දී ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් දිගටම පවත්වාගෙන යන,

යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

"නියමිත දිනය" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ බලාත්මක වන දිනය අදහස් වේ.

"ශ්‍රී ලංකාවේ පුරවැසියා" යන්නෙන් උපතින් හෝ බලපවත්නා යම් නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන යම් පුද්ගලයෙකු අදහස් වේ.

"දිස්ත්‍රික්කය" යන්නෙන් පරිපාලන දිස්ත්‍රික්කය අදහස් වේ.

"විදේශ ව්‍යාපාර ආයතනයක්" යන්නෙන්

i. හවුල්කරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත වූ ව්‍යාපාරයක් වන විට ඉන් එක හවුල්කරුවෙකු හෝ හවුල්කරුවන් දෙදෙනාම හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන්නා හෝ

ii. හවුල්කරුවන් දෙනෙකුට වැඩි ගණනකින් සමන්විත වූ ව්‍යාපාරයක් වන විට, ඔවුන් අතුරෙන් යටත් පිරිසෙයින් එක් හවුල්කරුවෙකු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන්නා වූ ව්‍යාපාර ආයතනයක් අදහස් වේ.

"මාසය" යන්නෙන් ලාභ හෝ පොලී හෝ අය කිරීමේ කාර්යය සඳහා වූ විට, දින 30ක කාල පරිච්ඡේදයක් අදහස් වේ.

"ලිත් වර්ෂය' යන්නෙන් සෑම වර්ෂයකම ජනවාරි මස පළමු වන දිනෙන් ආරම්භ වී දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් කාල පරිච්ඡේදය අදහස් වේ.

"මුදල් වර්ෂය" යන්නෙන් සෑම වර්ෂයකට අප්‍රේල් මස පළමු වන දිනෙන් ආරම්භ වී එළඹෙන වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනෙන් අවසන් කාල පරිච්ඡේදය අදහස් වේ.

"හැනැත්තා" යන්නට යම් පුද්ගලයෙක්, පුද්ගල මණ්ඩලයක්, සමාගමක් හෝ දෙපාර්තමේන්තුවක් අදහස් වේ.

"උකස් කරන්නා" යන්නෙන් උකස් කිරීම සඳහා යම් භාණ්ඩයක් උකස් ගන්නෙකු වෙත භාර දෙන තැනැත්තෙක් අදහස් වේ.

"ඔඩපනය" යන්නෙන් බඩු උකස් ගන්නෙකු වෙත උකස් තබන ලද භාණ්ඩය අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් මධ්‍යම පළාත් සභාව අදහස් වේ.

"පළාත් සභා අරමුදල" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද මධ්‍යම පළාතේ පළාත් සභා අරමුදල අදහස් වේ.

"ව්‍යාපාර ස්ථානය" යන්නෙන් වාසස්ථානයක්, ගුදමක්, සාප්පුවක්, සමාගමක්, හවුල් ව්‍යාපාරයක්, බද්ධ ව්‍යාපාරයක්, ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන කවර හෝ ස්ථානයක් සහ ඉහත සඳහන් කිසිවක් ශාඛාවක් වශයෙන් පවත්වාගෙන යනු ලබන කවර හෝ ස්ථානයක් අදහස් වේ.

"නොනිමි භාණ්ඩ හෝ ද්‍රව්‍ය" යන්නට භාණ්ඩ නැතහොත් ද්‍රව්‍ය කිසිවක් යම් නිෂ්පාදන තත්ත්වයට හෝ නිෂ්පාදන ක්‍රියාවලියට හෝ භාජනය කරනු ලැබීමෙන් පසු හෝ, භාණ්ඩ නැතහොත් ද්‍රව්‍ය කිසිවක් විෂයෙහි හෝ ඒවා යොදා ගනිමින් හෝ යම් නිෂ්පාදන ක්‍රියාවලියකට හෝ ක්‍රියාවකට භාජනය කිරීමෙන් පසු ද ඇඳීම හෝ පරිභෝජනය උදෙසා නිම කිරීමට හෝ නිමහම් කිරීමට හෝ පෙර ද ඒ භාණ්ඩ හෝ ද්‍රව්‍ය කලවම් හෝ වෙන වෙනම හෝ යම් නිෂ්පාදන තත්ත්වයක පවතී ද නැතහොත් යම් නිෂ්පාදනයක යම් කොටසක හෝ යම් අංශයක හෝ නිෂ්පාදනය කිරීම සඳහා පැහැදිලිවම අදහස් කර ඇති යට කී අන්දමේ ද්‍රව්‍ය කිසිවක් ද ඇතුළත් වේ.

"පොල්මෑකරු" යන්නෙන්, මියගිය තැනැත්තෙකුගේ පොල්මෑකරුවෙකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවෙකු අදහස් වන අතර, ඊට පහත දැක්වෙන අය ඇතුළත් වේ.

(අ) මියගිය තැනැත්තෙකු ගේ දේපලවල සන්තකය භාර ගන්නා වූ හෝ දේපල පරිශීලනය කරන්නා වූ තැනැත්තෙක් ; හෝ

(ආ) මිය ගිය තැනැත්තෙකුගේ මුදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තෙක් ; හෝ

(ඇ) භාරයේ කර්තෘගේ අන්තිම කැමති පත්‍රය යටතේ ඇති කරන ලද භාරයක් යටතේ ක්‍රියාකරන භාරකරුවෙක් අදහස් වේ.

"අනුයෝජිතයා" යන්නට වෙනත් යම් තැනැත්තෙකු වෙනුවෙන් යම් ව්‍යාපාරයක මෙහෙයවීම, පාලනය හෝ කළමනාකරණය භාරව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

"බලයලත් නියෝජිතයෙකු " යන්නෙන්,

මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා යම් තැනැත්තෙකු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූ ; සහ

(අ) පුද්ගලයෙක් සම්බන්ධයෙන් වන විට ඒ පුද්ගලයගේ ඥාතියෙක් වන්නා වූ ද,

(ආ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෙකු වන්නා වූ ද,

(ඇ) සමාගමක් සම්බන්ධයෙන් වන විට ඒ සමාගමේ අධ්‍යක්ෂකරයෙකු හෝ ලේකම්වරයා වන්නාවූ ද,

(ඈ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයෙකු වන්නා වූ ද,

(ඉ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන්නා වූ ද,

(ඊ) නීතිඥවරයෙක් වන්නා වූ ද, පුද්ගලයෙක් අදහස් වේ.

"ලියාපදිංචි බැංකුවක් " යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රධාරී වාණිජ බැංකුවක් අදහස් වේ.

64. මේ පනතේ සිංහල සහ දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. *අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව*

(4 වන වගන්තිය)

## පළමුවන උපලේඛනය

### "අ" ආකෘතිය

### බලපත්‍රය

අංකය :..........................

මධ්‍යම පළාත් ආදායම් කොමසාරිස් ........................................................................................නැමැති මම, මධ්‍යම පළාත් සහා සීමා තුළ ........................................................................................ස්ථානයෙහි පිහිටි ........................................................................................යන ව්‍යාපාර නාමය යටතේ බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට ....................................................................පදිංචි ට මධ්‍යම පළාත් සභාවේ අංක ............................................................දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ මෙයින් බලය දී බලපත්‍රය දෙමි.

මෙම බලපත්‍රය ............................................................දිනෙන් අවසන් වන්නේ ය.

......................................
පළාත් ආදායම් කොමසාරිස්,
මධ්‍යම පළාත,
(නිල මුද්‍රාව).

දිනය :..........................

(19 වන වගන්තිය)

"ආ" ආකෘතිය

ඔඩපන පොත

.................................................. හි බඩු උකස් ගන්නා වන .................................................. ඔඩපන පොත

| උකස් තුණ්ඩුවේ අංකය හා එය නිකුත් කළ දිනය | මාසයේ ඔඩපාන අංකය | එක් එක් භාණ්ඩය සඳහා දුන් ණය මුදල | එක් එක් භාණ්ඩය සඳහා අය කළ ලාභ හෝ පොලී | උකස් කරන්නාගේ නම | උකස් කරන්නාගේ ලිපිනය | උකස් කරන්නා අයිතිකරු නොවන විට, අයිතිකරුගේ නම | උකස් කළ එක් එක් භාණ්ඩයේ විස්තර | උකස් කළ භාණ්ඩය ස්වර්ණාභරණයක් නම්, එහි බර | උකස් කළ එක් එක් භාණ්ඩයේ වටිනාකම | නිදහස් කර ගැනීමේ දිනය | නිදහස් කර ගන්නාගේ නම සහ ලිපිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | | | | | | | | |

(19 වන වගන්තිය)

"ඇ" ආකෘතිය

ඔඩපන විකුණුම් පොත

විකිණීම කළ දිනය හා ස්ථානය :..................................................

වෙන්දේසිකරුගේ නම සහ ලිපිනය :..................................................

| ඔඩපන පොතේ දැක්වෙන අන්දමට ඔඩපනයේ අංකය | උකස් කළ දිනය | උකස්කරුගේ නම | ණය මුදලේ ප්‍රමාණය | අය විය යුතු පොළී ප්‍රමාණය | වෙන්දේසිකරු විසින් එක් එක් ඔඩපනය විකුණන ලද මුදල | මිලට ගත් තැනැත්තාගේ නම හා ලිපිනය |
|---|---|---|---|---|---|---|
| | | | රු. ශ. | රු. ශ. | රු. ශ. | |

(අනික් පිටුවට)
(20 වන වගන්තිය)

"ඇ" ආකෘතිය

උකස් කුණ්ඩුව

උප පත්‍රිකා අංකය :..................................

බඩු උකස් ගන්නා වෙත තබා ගත යුතු ය.

දිනය :..................................

බඩු උකස් ගන්නාගේ නම හා ලිපිනය

..................................................................................................

..................................................................................................

අංක .....................................................දරන ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය දරන මෙහි පහත අත්සන් කරන (උකස් ගන්නාගේ ලිපිනය)

..................................................................................................

පදිංචි ..................................................................................

වන මම ඉහත නම් සඳහන් බඩු උකස් ගන්නා වෙත රු. ......................................................ක් වටිනා රු. ..................................කට අද දින උකස් කළෙමි.

...................
(අත්සන)
(මුද්‍රාව)

මුල් පත්‍රිකාවේ අංකය :..................................

දිනය :..................................

..................................................................................................

(උකස් කරන්නාගේ නාම හා ලිපිනය) විසින් මෙහි පහත අත්සන් කරන..................................................................

බඩු (උකස් ගන්නාගේ නාම හා ලිපිනය) වෙත රු. .........................................................................කට අද දින උකස් කරන ලදී.

බඩු උකස් ගන්නාගේ හෝ ඔහුගේ සේවකයාගේ හෝ නියෝජිතයාගේ අත්සන

නම :..................................................................................

අත්සන :..................................................................................

(අත්සන හෝ නම ලිවීමට නොහැකි නම් ඔහුගේ වම් මාපට ඇඟිලි සලකුණ)

(24 වන වගන්තිය)

"ඉ" ආකෘතිය

**උකස් කරන්නාගේ අත්සනින් පිටපත් නොකරන ලද උකස් කුණ්ඩුවක මුල් පත්‍රිකාව 24 වැනි වගන්තිය යටතේ භාර දෙනු ලබන විට කළ යුතු ප්‍රකාශය**

පහත විස්තර කර ඇති භාණ්ඩ/භාණ්ඩය ..........................................................................................................විසින් බඩු

උකස් ගන්නෙකු වන ..........................................................................................ගේ සාප්පුවෙහි දී උකස් තබන ලද

බවත්, ඒ සඳහා වූ උකස් කුණ්ඩුවේ මුල් පත්‍රිකාව ලබා ගෙන ඇති බවත් එකී ..........................................................උකස්

කරන්නා මියගොස් ඇති නිසා/...............................................................................................................හේතුකොට

ගෙන සිදුවී ඇති නෛතික අශක්තුතාවය යටතේ සිටින නිසා ඒ ඔඩපතය බේරා ගැනීම සඳහා එකී උකස් කරන්නාගේ අත්සනින් එම

උකස් කුණ්ඩුවේ මුල් පත්‍රිකාව පිටපත් කරවා ගෙන ඉදිරිපත් කළ නොහැකි බවත් .....................................................අංක

දරන ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය දරන .........................................................................................................

පදිංචි (ඒ බී) ..........................................................................................වන මම බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ

විධිවිධාන අනුව ගාම්භීරතා පූර්වකවත්, අවංකවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

("ඒ බී" ගේ) අත්සන :...................................

ඉහත සඳහන් භාණ්ඩය/භාණ්ඩ ...............................................................................................වේ.

මෙහි ඉහත සඳහන් ප්‍රකාශ කරන

තැනැත්තා......................................................................................................................................නි

පදිංචි ..................................................................................("ඒ බී") තැනැත්තා යැයි මා දන්නා බව (සී ඩී)

වන මම එකී ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ගාම්භීරතා පූර්කව මෙයින් ප්‍රකාශ කරමි.

("සී ඩී" ගේ) අත්සන :...................................

20..............ක් වූ .................................මස ..................වැනි දින ..............................................................මා ඉදිරියේ
දී ප්‍රකාශ කොට අත්සන් කරන ලදී.

.........................................
සාමදාන විනිශ්චයකාරවරයා
(මුද්‍රාව)

(26 වන වගන්තිය)

## "ඊ" ආකෘතිය

### උකස් කුණ්ඩුවේ මුල් පත්‍රිකාව නැතිවීම ආදියක දී කළ යුතු ප්‍රකාශය

මෙම ප්‍රකාශය අසත්‍ය එකක් වුවහොත් මෙම ප්‍රකාශය කරන තැනැත්තාව දඬුවම් විඳීමට සිදුවන බව දැන ගත යුතු ය.

බඩු උකස් ගන්නෙකු වන ..............................................................................................ගේ සාප්පුවෙහි දී පහත විස්තර කරන භාණ්ඩය/භාණ්ඩ ...................................................විසින් උකස් කරන ලද බවත් ඒ සඳහා වූ උකස් කුණ්ඩුවේ මුල් පත්‍රිකාව ලබා ගන්නා ලද බවත් එම මුල් පත්‍රිකාව ඉන් පසු ..............................අතින් ....................................බවත් මුල් පත්‍රිකාව ඉන් පසු අතින් බවත් මුල් පත්‍රිකාව ...................................................විසින් ...................................හෝ හෝ නැති බවත් අංක ...............................................................දරන ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය දරන්නා වූ ..........................................................පදිංචි (ඒ බී) .............................................වන මම බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාර ගාම්භිරතා පූර්වකවත්, අවංකවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

("ඒ බී" ගේ) අත්සන :.......................................

ඉහත සඳහන් භාණ්ඩ/භාණ්ඩය පිළිබඳ විස්තර පහත දැක්වේ.

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

මෙහි ඉහත සඳහන් ප්‍රකාශය කරන තැනැත්තා ..............................................................................................හි (ඒ බී) ....................................................................................................................................................... නැමැති තැනැත්තා යැයි මා දන්නා බව (සී ඩී) ..............................................................................................වන මම එකී ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ගාම්භිරතා පූර්වකවත්, අවංකවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

("සී ඩී" ගේ) අත්සන :...............................

20...............ක් වූ ..................................මස ....................වැනි දින ..............................................................................මා ඉදිරිපිට දී ප්‍රකාශ කොට අත්සන් කරන ලදී.

..........................................
සාමදාන විනිශ්චයකාරවරයා/දිවුරුම් කොමසාරිස්.
(මුද්‍රාව)

(31 වන වගන්තිය)

"උ" ආකෘතිය

ලදුපත

දිනය :..........................................

අංක ......................................දරන ඔඩපනය නිදහස් කිරීමෙන් ලැබුණා

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ණය මුදල | ............................... | ............................... |
| ලාභය හෝ පොළිය | ............................... | ............................... |
| ව්‍යාපාර පිරිවැටුම් බද්ද | ............................... | ............................... |

..........................................

උකස්ගන්නාගේ අත්සන

(20 වන වගන්තිය)

## දෙවන උපලේඛනය

**පොළී අනු ප්‍රමාණය**

ණයට දෙනු ලබන සෑම රුපියලක් හෝ රුපියලකින් කොටසක් සඳහා පොළී අනු ප්‍රමාණය සෑම මාසයක් හෝ මාසයකින් කොටසක් සඳහා ශත දෙකක් විය යුතු ය.

**බදු ගෙවීම**

ඔඩපනයක් මත දෙනු ලබන ණයක් වෙනුවෙන් බඩු උකස් කරන්නෙකු විසින් ලිඛිත නීතියක් යටතේ වූ යම් බද්දක් ගෙවිය යුතු අවස්ථාවක, එම බද්ද උකස්ගන්නා විසින් ඔහුගෙන් අයකර ගත හැක.

**වැඩිපුර පොළී අයකිරීම සීමා කිරීම**

යම් දිනක සිට වැඩිපුර පොළියක් අයකර ගැනීමට බඩු උකස් ගන්නෙකුට හිමිකම් ඇති අවස්ථාවක දී එදිනට පෙර උකස් බඩු නිදහස් කර ගැනීමට තමාට නොහැකි වූයේ එදිනට පෙර දිනයෙහි පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වා වූ කාලය තුළ ඒ බඩු උකස් ගන්නාගේ සාප්පුව වසා තිබුණ නිසා බව නිසි අධිකරණ බලය ඇති සිවිල් අධිකරණයක් සෑහීමට පත්වන අයුරු උකස් කරන්නා විසින් ඔප්පු කරනු ලැබුවහොත් එවැනි වැඩිපුර පොළියක් අයකර ගැනීමට බඩු උකස් ගන්නාට හිමිකම නැත.

ඒ උකස් තුණ්ඩුවට අදාළ ඔඩපනය එය උකස් කළ දින සිට මාස 24ක කාලයක් තුළ දී බේරා ගනු නොලැබුවහොත් ඒ ඔඩපනය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය හැකිය.

එසේ විකිණීමේදී ලැබුණු යම් අතිරික්ත ලාභයක් වේ නම්, එය එකී විකිණීමේ දින සිට එක් අවුරුදු කාලයක් තුළ දී උකස් කරන්නා විසින් ඉල්ලා නොසිටියහොත්, ඒ අතිරික්ත ලාභය ඒ උකස්කරන්නාගේ බැරට එක් අවුරුදු කාලයකට පළාත් සභා අරමුදලේ තැන්පත් කරනු ලැබිය යුතු ය.

(32 වන වගන්තිය)

## තුන්වන උපලේඛනය

## ඔඩපන වෙන්දේසි කිරීමට අදාළ නියෝග

1. වෙන්දේසි කරනු ලබන සියළුම ඔඩපන මහජනයා විසින් දැක බලාගනු පිණිස වෙන්දේසිකරු විසින් විවෘතව තැබිය යුතු ය.

2. ඔඩපන සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු ප්‍රකාශ කෙරෙන නාමාවලියක් වෙන්දේසිකරු විසින් ප්‍රසිද්ධ කළ යුතු ය.

   (අ) බඩු උකස් ගන්නාගේ නම සහ ව්‍යාපාරික ස්ථානය

   (ආ) ඒ ඔඩපනය උකස් කළ මාසය

   (ඇ) එක් එක් ඔඩපනය උකස් කරනු ලැබූ අවස්ථාවේදී ඔඩපන පොතෙහි ඇතුළත් කරන ලද ආකාරයට ඒ එක් එක් ඔඩපනයේ අංකය

3. එක් එක් බඩු උකස් ගන්නා වෙත ඇති ඔඩපනය ඒ නාමාවලියෙහි වෙනත් යම් බඩු උකස් ගන්නෙකුගේ ඔඩපන වලින් වෙන් කොට දැක්විය යුතු ය.

4. විකිණීම පිළිබඳ දැන්වීම වෙන්දේසිකරු විසින් යටත් පිරිසෙයින් එක් සිංහල එක් දෙමළ සහ එක් ඉංග්‍රීසි පුවත්පතක ප්‍රසිද්ධ කළ යුතු අතර විකිණීම කරනු ලබන ප්‍රදේශයේ මහජනයා ගැවසෙන ස්ථානවල ඒ දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතු ය. තව ද ඒ දැන්වීම්වල පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය.

   (අ) බඩු උකස් ගන්නාගේ නම සහ ව්‍යාපාරික ස්ථානය සහ

   (ආ) ඒ ඔඩපනය උකස් කළ මාසය

5. ඒ දැන්වීම එකම පුවත්පතෙහි දින 02ක් බැගින් පළ කළ යුතු අතර, දෙවෙනි දින දැන්වීම පළ කළ යුත්තේ විකිණීම කරන පළමුවන දිනයට යටත් පිරිසෙයින් පැහැදිලි දින 10කට පෙර ය.

6. යම් විකිණීමකදී බඩු උකස් ගන්නා ලංසු තබන විට ඒ විකිණීමේදී වෙනත් යම් තැනැත්තන් විසින් තබනු ලබන ලංසු වලට වඩා වෙනත් අන්දමකින් වෙන්දේසිකරු විසින් ඒ ලංසු ගැන සැළකිල්ලක් නොදැක්විය යුතු අතර, යම් භාණ්ඩයක් බඩු උකස් ගන්නා විසින් මිලදී ගනු ලැබූ විට ඒ භාණ්ඩය මිලට ගත් තැනැත්තා වශයෙන් ඒ බඩු උකස් ගන්නාගේ නම වෙන්දේසිකරු විසින් නොපමාව හඬනගා ප්‍රකාශ කළ යුතු ය.

7. ඒ විකිණීමෙන් පසු දින 14ක් තුළ දී, නාමාවලියේ පිටපතක් හෝ ඒ බඩු උකස් ගන්නාගේ ඔඩපනවලට අදාළ ඒ නාමාවලියේ කොටසේ පිටපතක් ඒ බඩු උකස් ගන්නාගේ ඔඩපන විකුණූ මුදල් ප්‍රමාණය ඇතුළත් කොට වෙන්දේසිකරුගේ අත්සන යොදා එය සත්‍යායනය කොට ඒ බඩු උකස් කරන්නාට වෙන්දේසිකරු විසින් භාර දිය යුතු ය.

8. බඩු උකස් ගන්නා විසින් ඒ වෙන්දේසියෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 02ක කාලයක් එවන් සෑම නාමාවලියක්ම සුරක්ෂිතව තබාගත යුතු ය.

07- 615

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1936/33 - 2015 ඔක්තෝබර් මස 14 වැනි බදාදා - 2015.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

2015 අංක 01 දරන මධ්‍යම පළාත් සභාවේ බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් 2015.10.06 දින සම්මත කරන ලදුව 2015.10.07 වැනි දින ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කොට ඇති ඉහත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළකරමි.

සරත් ඒකනායක,<br>
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන,<br>
නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල,අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,<br>
සංචාරක, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා<br>
බෙදාහැරීමේ කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 09 වැනි දින,<br>
මහනුවර.<br>
මධ්‍යම පළාත් සභාවේ,<br>
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය කෙටුම්පත**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පළාතේ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දිනයේ සිට බලාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) උපවගන්තියේ (ආ) වාක්‍යාංශය වෙනුවට පහත දැක්වෙන අලුත් වාක්‍යාංශය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(ආ) මෙම ප්‍රඥප්තියේ 46 (1) වගන්තියේ විධිවිධාන පරිදි සකස් කරන ලද සාධන පත්‍රයක් හා

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වගන්තියේ 3 වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

(3) ආදායම් කොමසාරිස්වරයා විසින් තැන්පත් කරන ලෙසට බලපත්‍රලාභියා වෙත දන්වනු ලබන ඇප මුදල හෝ ඇප මුදල් පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත තැන්පත් කරනු ලැබිය යුතු අතර, ව්‍යාපාරය එසා දැමීමේදී හෝ පැවරීමේදී හැර තැන්පත් මුදල තැන්පත්කරුට ආපසු ගෙවනු නොලැබිය යුතුය. එසේ වුවද, බලපත්‍රලාභියා විසින් භාණ්ඩ උකස් කරුවකු හෝ උකස් කරුවන් වෙත කිසියම් මුදලක් ගෙවිය යුතු වේ නම් එම මුදල, තැන්පත් මුදලින් අඩුකරගනු ලැබිය යුතුය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

බලපත්‍රලාභීන්ගේ නම හා ලිපිනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු කරුණු ලේඛනය.

13 (1) වාර්ෂිකව බලපත්‍රලාභී සෑම බඩු උකස් ගන්නෙකුගේම නම, ව්‍යාපාර නාමය සහ එම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ලිපිනය ;

(2) පහත 39 වගන්තිය යටතේ වරදකරු කරනු ලබන සෑම අවස්ථාවකදීම එම තැනැත්තාගේ නම, පෞද්ගලික ලිපිනය, ව්‍යාපාර නාමය, ව්‍යාපාරය පවත්වා ගෙන ගිය ස්ථානයේ ලිපිනය ද, යම් බලපත්‍රලාභියෙකුගේ බලපත්‍රය වලංගු කාලය ඉක්ම ගොස් තිබේ නම් සහ අනුගාමී වර්ෂයට බලපත්‍රයක් නිකුත් නොකරන ලද්දේ නම්, හෝ, ආදායම් කොමසාරිස්වරයා විසින් රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

ව්‍යාපාරය ඇවර කර ගන්නා විට ආපසු දෙනු ලබන ඉතිරි ශේෂය නියම කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වගන්තියේ 3 වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

(3) යම් තැනැත්තෙකු විසින් බඩු උකස් ගන්නකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යෑම අත්හරින ලද අවස්ථාවකදී ඔහු විසින් තබා ඇති ඇප මුදලින් (1) වන උපවගන්තියෙන් සඳහන් මුදල ගෙවීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් වේ නම් එම මුදල අඩුකරගෙන ඉතුරු මුදල ඒ බඩු උකස්ගන්නාට ගෙවිය යුතුය.

අනනුකූලතාවයන් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

6. මේ පනතේ සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර, යම් අනනුකූලතාවයන් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

මධ්‍යම පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධිත) ප්‍රඥප්ති කෙටුම්පත 2015.10.06 දින පැවති මධ්‍යම පළාත් සභා රැස්වීමේදී ඒකමතිකව සභා සම්මත වූ බව සහතික කරමි.

10 - 1090

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

(17)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1990/15 - 2016 ඔක්තෝබර් මස 26 වැනි බදාදා - 2016.10.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

2016 අංක 01 දරන මධ්‍යම පළාත් සභාවේ බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් 2016.08.23 දින සම්මත කරන ලදුව 2016.09.15 වැනි දින ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කොට ඇති ඉහත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළකරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය
සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය,
පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
සංචාරක, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ,
ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු සහ
ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 17 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**මධ්‍යම පළාත් සභාවේ 2016 අංක 01 දරන මධ්‍යම පළාත් සභාවේ**
**බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2016 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පළාතේ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දිනයේ සිට බලාත්මක වන්නේ ය.

1A - PG 3192 — 09 (2016/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

22 වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන 2014 අංක 04 දරන බදු උකස් ගනුදෙනුවේ ප්‍රඥප්තියේ 22 වගන්තියේ "එය උකස් කරන ලද දින සිට එළඹෙන මාස 24 ක්" යන වාක්‍යාංශය ඉවත් කොට "එය උකස් කරන ලද දින සිට එළඹෙන මාස 12 ක්" යන වාක්‍යාංශය ආදේශ කිරීමෙන් මෙයින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

63 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ "ලියාපදිංචි බැංකුවක්" යන යෙදුමෙහි අර්ථ නිරූපනය වෙනුවට පහත දක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ලියාපදිංචි බැංකුව යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී බැංකුවක් අදහස්වේ.

දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ ඇතුළත් "ඒ උකස් කුණ්ඩුව අදාළ ඔඩපනය එය උකස් කළදින සිට මාස 24 කදී බේරා ගනු නොලැබුවහොත් එම ඔඩපනය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය හැකිය." යන වාක්‍යාංශය ඉවත් කර ඒ වෙනුවට පහත වාක්‍යාංශය ආදේශ කිරීමෙන් දෙවන උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"ඒ උකස් කුණ්ඩුව අදාළ ඔඩපනය එය උකස් කළ දින සිට මාස 12 කදී බේරාගනු නොලැබුවහොත් එම ඔඩපනය ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ."

5. මෙ පනතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

(18)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1936/34 - 2015 ඔක්තෝබර් මස 14 වැනි බදාදා - 2015.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

මධ්‍යම පළාතේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය

**50(1) වගන්තිය යටතේ නියෝගය**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 50(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ අමාත්‍ය සරත් ඒකනායක වන මම බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියට අදාළ පහත සඳහන් සංශෝධන 2015 ඔක්තෝබර් මස 09 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමට මෙයින් නියම කරමි.

**නියෝග**

අ. 8(3) උප වගන්තිය - බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ලියාපදිංචි ගාස්තුව - රු. 25,000.00

ආ. 10(2) උප වගන්තිය -

i. බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව - රු. 5,000.00

ii. බලපත්‍රලාභියෙකු විසින් තැන්පත් කළ යුතු ඇප මුදල - රු. 100,000.00

ඇ. යම් භාණ්ඩයක් උකස් තැබීම සඳහා බඩු උකස්ගන්නෙකු වෙත ඉදිරිපත් කිරීමේදී උකස් කරන්නා විසින් ඉදිරිපත් කළ යුතු ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රයෙහි ඡායා පිටපතක් සෑම බඩු උකස් ගන්නෙකු විසින්ම තම භාරයේ රඳවා තබා ගත යුතුය.

සරත් ඒකනායක,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
සංචාරක, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා
බෙදාහැරීමේ කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 09 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

10 - 1091


IA - PG 2639 - 08 (2015/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1976/2 - 2016 ජූලි මස 18 වැනි සඳුදා - 2016.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

**මධ්‍යම පළාතේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය**

**50(1) වගන්තිය යටතේ නියෝගය**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 50(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ අමාත්‍ය සරත් ඒකනායක වන මම බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියට අදළ පහත සඳහන් සංශෝධන 2016 මැයි මස 31 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමට මෙයින් නියම කරමි.

***නියෝග***

ආ. 10(2) උප වගන්තිය -

බලපත්‍රලාභියා සමූපකාර ග්‍රාමීය බැංකුවක් වන අවස්ථාවක තැන්පත් කළ යුතු ඇප මුදල වෙනුවෙන් සමූපකාර කොමසාරිස්වරයාගෙන් ලබාගත් ඇප සහතිකයක් ඉදිරිපත් කළ හැක.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
සංචාරක, ඉඩම්, සමූපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා
බෙදහැරීමේ කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍ය.

2016 මැයි මස 31 වැනි දින,
මහනුවර.
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

08-14


1A - PG 3021 17 (2016/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.